# පුරවැසි අධ්‍යාපනය

## 7 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශය

(2016 සිට ක්‍රියාත්මක වේ)



සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk
මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# පුරවැසි අධ්‍යාපනය

## ගුරු මාර්ගෝපදේශය
## 7 ශ්‍රේණිය

**(2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල: info@nie.lk

පුරවැසි අධ්‍යාපනය
7 ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2015

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN ..............

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : nifo@nie.lk

මුද්‍රණය : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
ප්‍රින්ට්කෙයාර් (පුද්ගලික) සමාගමේ මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

# ඉගෙනුම සහ ඉගැන්වීම

මෙම ගුරු මාර්ගෝපදේශය මගින් ගුරුභවතාට තම පාසල තුළ විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන මූලික දෑ සැපයේ. විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරුන් තම කාර්යයන්, දරුවාගේ බුද්ධි වර්ධනය කෙරෙහි මෙන් ම, චර්යාත්මක දියුණුව කෙරෙහි ද දිගු කාලීන බලපෑමක් ඇති කරවන බව නිරන්තරයෙන් ම සිහි තබා ගත යුතු වේ.

ප්‍රජානන සාධන මානය සම්බන්ධයෙන්, අනෙක් කරුණු අතරට, ඉගෙනීම ඉහළ මට්ටමකට ගෙන යාමට පහත සඳහන් කරුණු කෙරෙහි ද ගුරුවරුන් සැලකිලිමත් විම යුතු වේ.

- ශිෂ්‍යයා තම ජීවිත අරමුණු පිළිබඳ අවදියෙන් සිටීම සහ කළ යුතු කාර්යය, හැකියාවන්ට සහ අරමුණු සාධනයට අදාළ වීම.

- ශිෂ්‍යයා ක්‍රියාකාරීව ඉගෙනුම් කාර්යාවලියෙහි නිරත වීම. (ඉගෙනීම සිසු කේන්ද්‍රීය ක්‍රියාවලියක් වීම.) කන්පියුසිස් ගේ කියමන සිහියට නගා ගන්න; ඇසෙන දේ අමතක වේ. දකින දේ අමතක නොවේ. කළ දේ ඉගෙන ගැනේ.

- ඉගෙනුම් වාතාවරණය, ධනාත්මක ව, අභියෝගාත්මක වී, ඉගෙනුම් මෙවලම්, උපකරණ, විද්‍යාගාර, විවිධ සම්පත් ආකාරවලට පිවිසුම පහසු වීම.

- ශිෂ්‍යාට ක්ෂණික ධනාත්මක සහ නිර්මාණාත්මක ප්‍රතිචාරයන් ලබා දීම මගින්, ඉගෙනුම ක්‍රමාණුකූල ව ඉහල මට්ටමක අවශෝෂණයකින්, ශිෂ්‍යාගේ දැනුම, කුසලතා සහ අරමුණු සමග අනුකූලනයකට අවකාශ ඇති කිරීම.

අධ්‍යාපනයේ දී, රජයේ අපේක්ෂාව වනුයේ සියළු පාසල්වල සියළු දරුවන්ට, මූලික විෂය කරුණු අවශ්‍ය මට්ටමකට ග්‍රහණය කිරීමෙන්, විභාගයට මුහුණ දීමෙන් පසුව සාර්ථකත්වයේ සතුට විඳ ගැනීමේ හැකියාව ලබාදීමය.

දරුවාගේ චර්යාත්මක වර්ධනයට අදාළ මානය සලකා බැලූ විට අධ්‍යාපනයේ පරමාර්ථය වනුයේ ප්‍රජානන හැකියාවන් වැඩ ලෝකය සමග සම්බන්ධ කිරීමයි. එබැවින් ගුරුවරුන් තමතින් විෂය නිර්දේශ ලබා දීමේ දී වර්ධනය කළ යුතු වන්නේ, පාසලින් බැහැර ලෝකය සමග ගනුදෙනු කිරීමට ශිෂ්‍යාට අවශ්‍ය වන, දක්ෂතා සහ කුසලතා ය. එයින් සමහර වැදගත් ගණිය හැකියාවන් පහත සඳහන් ක්ෂේත්‍රයන් හි වේ.

- කාර්යශීලී වැඩ ආචාර ධර්ම - සාධනීය ආකල්ප සහ නව නිර්මාණයට, සංරක්ෂණයට ඇති ලැදියාව

- අන්තර් පුද්ගල සම්බන්ධතා - කණ්ඩායම් වැඩ, විනය සහ කාර්යක්ෂම සන්නිවේදනය

- සදාචාරාත්මක හර - විවිධත්වයට ගරු කිරීම වැනි පුරවැසි වටිනාකම්වලින් හෙබි, ඍජු පුද්ගලයෙක්

අවසාන වශයෙන් මම සියළු විදුහල්පතිවරුන්ටත්, ගුරු භවතුන්ටත්, පාසල්වල අනෙක් කාර්ය මණ්ඩල සභිකයන්ටත්, ඉතා ඕනෑකමින් ඉගෙනුම් ඉගැන්වීම ක්‍රියාවලිය දෙස කළමණාකරණයේ ඒ 4 වශයෙන් හඳුන්වන පහත සඳහන් කරුණු මගින් තම සැලකිල්ල යොමු කරන මෙන් ඉල්ලීමට කැමැත්තෙමි. එනම් ආකල්පය, විශ්ලේෂණය, ක්‍රියාව සහ වගවීමයි. ඔබ නියුක්ත වන කාර්යයෙහි (පාඩම ආදී වශයෙන්) අවසානයත්, මාර්ගයන් පිළිබඳ අදාළ සාධනීය ආකල්පයන්ගෙන් ආරම්භ කරන්න. එය සංවිධානය කර

ගැනීම උදෙසා (වරු ඒකක ආදී වශයෙන්) තොරතුරු සොයා බලා ලබාගෙන ඒවා විශ්ලේෂණය කරන්න. විකල්ප සලකා බලා ක්ෂණික ක්‍රියා (ප්‍රකාශ කිරීම, බාරදීම) කාර්යක්ෂමව ගන්න. ඔබ ප්‍රතිඵල අධීක්ෂණය, ඇගයීම සහ මිණුම සම්බන්ධයෙන් (අයිතිය) වගකීම බාර ගන්න.

මේ හා සම්බන්ධ සියළු ගුරු භවතුන්ට, ඉගැන්වීමේ දීත් ඉගෙනීමේ දීත් සතුට අත්වේවා යයි ප්‍රර්ථනා කිරීමට මම මෙය අවස්ථාව කර ගනිමි. අවශ්‍ය වුවහොත් මට ද පිටපතක් සහිතව ජාතික අධ්‍යාපන ආයතනයේ අදාළ දෙපාර්තුමේන්තු ප්‍රධානීන්ට මෙම මාර්ගෝපදේශය පිළිබඳ ඔබේ අත්දැකීම් සහ නිරීක්ෂණ ලියා දන්වා එවීමට නොපසුබට වන්න.

මහාචාර්ය ගුණපාල නානායක්කාර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකිය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## පෙරවදන

සමාජ ප්‍රගමනයෙහි ලා මහගු මෙහෙවරක නියැලෙන්නන් අතර ගුරුවරු ප්‍රමුඛ වෙති. ස්වකීය ජීවිතය සකස් කර ගැනීම සඳහා දරුවන්ට මග පෙන්වන්නෝ ගුරුවරු ය.

2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙන නව විෂය නිර්දේශයට අදාළ ඉගැන්වීම් කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ගුරුවරුන්ට පහසුකම් සැපයීමේ අරමුණින් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ මුද්‍රණය කර බෙද හැරීමට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව කටයුතු කරයි. ජාතික අධ්‍යාපන ආයතනය මඟින් සම්පාදිත මේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ, දරුවන්ට මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර දීමට අවශ්‍ය මග පෙන්වීම ගුරුවරුන් වන ඔබ වෙත ලබා දෙනු ඇතැයි යන්න මාගේ විශ්වාසය යි.

මේ ප්‍රයත්නය යථාර්ථයක් වන්නේ මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිශීලනයෙන් ලබන පරිචය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොද ගැනීමට දරන උත්සාහය මත ය. ඒ සඳ් කාර්යය සඳහා කැප වී සිටින ඔබට මාගේ ගෞරවය පිරිනමමි.

**තිස්ස හේවාවිතාන**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2015.09.22

| | |
|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | **ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය** |

**සම්බන්ධීකරණය**

| | |
|---|---|
| ඒ.එල්.එස්. අබේවික්‍රම | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |

**ලේඛක මණ්ඩලය (බාහිර)**

| | |
|---|---|
| සී.එස් ජයසිංහ | ගුරු මධ්‍යස්ථාන කළමනාකරු (විශ්‍රාමික), හොරණ |
| පී.ඩී. සෝමාවතී | ගුරු උපදේශිකා (විශ්‍රාමික)<br>බුලත්සිංහල |
| පී.පී. මාලිකා | ගුරු උපදේශිකා<br>හම්බන්තොට |
| එම්.කේ කිංස්ලි ප්‍රියන්ත | කථිකාචාර්ය<br>රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, වලහන්දුව, ගාල්ල |
| එම්.එච්.එම්. යාකුත් | ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි (විශ්‍රාමික)<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| කේ.ඒ.එන්. පුෂ්පකුමාර | ගුරු සේවය<br>පොලේගොඩ ම.වි, මහගම |
| ආචාර්ය ශාමින්ද වනසිංහ | කථිකාචාර්ය<br>අධ්‍යාපන පීඨය<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ |
| නීතිඥ වසන්තා සෙනෙවිරත්න | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>පොදු හා අන්තර්ජාතික නීති අධ්‍යයන අංශය<br>නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |

**ලේඛක මණ්ඩලය (අභ්‍යන්තර)**

| | |
|---|---|
| ඒ.එල්.එස්. අබේවික්‍රම | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| එස්.යූ.අයි.කේ ද සිල්වා | කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| එස්. කරුණාකරන් | කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |

**භාෂා සංස්කරණය**

| | |
|---|---|
| එච්.පී. සුසිල් සිරිසේන | කථිකාචාර්ය<br>හාපිටිගම ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, මීරිගම |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

2007 වර්ෂයේ සිට 6 - 9 ශ්‍රේණි සඳහා ක්‍රියාත්මක වූ ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂය කොටස් දෙකකින් සමන්විත විය. ඒ අනුව I කොටස ජීවන නිපුණතා නමින් ද II කොටස පුරවැසි අධ්‍යාපනය නමින් ද හැඳින්විය.

මෙම විෂය පාසල් මට්ටමෙන් ක්‍රියාත්මක වීමේ දී මෙසේ විෂය කොටස් දෙකක් ලෙස පැවතීම ඉගෙනුම්, ඉගැන්වීම් ඇගයීම් ක්‍රියාවලියේ දී ප්‍රායෝගික වශයෙන් ගැටලු ඇති වීමට හේතු විය. මේ සම්බන්ධයෙන් විෂය ප්‍රවීණයන්, ගුරු උපදේශකවරුන්, ගුරුවරුන් මෙන් ම ශිෂ්‍යශිෂ්‍යාවන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් හා පර්යේෂණ අනාවරණයන් හි ප්‍රතිඵල සැලකිල්ලට ගෙන පුරවැසි අධ්‍යාපනය නමින් තනි විෂයක් ලෙස 2015 සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

මෙහි දී 6 - 9 ශ්‍රේණිවල ඇතුළත් ව තිබූ ජීවන නිපුණතා විෂයයේ හා පුරවැසි අධ්‍යාපනය විෂයයේ ඇතුළත් විෂය අන්තර්ගතයන් හි සමානකම් සැලකිල්ලට ගෙන යෝග්‍ය පරිදි එක් විෂයක් ලෙස නව විෂයයේ අන්තර්ගතය සකස් කර ඇත. ඒ අනුව ඉගෙනුම්, ඉගැන්වීම්, ඇගයීම් ක්‍රියාවලිය වඩාත් පහසු වන ආකාරයටත්, විෂය අරමුණු ඉටු වන ආකාරයටත් ඉදිරිපත් කර ඇත.

මේ අනුව 2015 සිට ක්‍රියාත්මක වන පුරවැසි අධ්‍යාපනය විෂයය 6 - 11 දක්වා ම තනි විෂයක් ලෙස ක්‍රියාත්මක වේ. එහි දී 6 - 9 ශ්‍රේණි සඳහා සතියකට කාල පරිච්ඡේද දෙකක් ද, 10 -11 ශ්‍රේණි සඳහා කාල පරිච්ඡේද තුනක් ද වෙන් කර ඇත.

7 වන ශ්‍රේණියට අදාළ මෙම පුරවැසි අධ්‍යාපනය ගුරු අත්පොත පරිශීලනය කිරීමේ දී එක් එක් නිපුණතාවට, නිපුණතා මට්ටමට අදාළ ව ඉදිරිපත් කර ඇති ඉගෙනුම් පල සාක්ෂාත් කරගත හැකි පරිදි ඉගෙනුම් ක්‍රියාවලිය සිදු කළ යුතු වේ. ඒ සඳහා අවශ්‍ය පාඩම් සැලසුම් සකස් කිරීමේ දී ආවරණය කළ යුතු විෂය කරුණු අවශ්‍ය උදාහරණ සහිත ව දක්වා ඇත. ගුරු අත්පොත භාවිතයට ගැනීමේ දී එක් එක් මතෘකාවට සමගාමී ව පෙළ පොතෙහි ඇතුළත් කර ඇති කරුණු හා ක්‍රියාකරකම් ද සැළකිල්ලට ගෙන කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. මෙහි ඇතුළත් කර ඇති ගුණාත්මක යෙදවුම් උදාහරණ වන අතර අවශ්‍ය පරිදි ඒවා වෙනස් කර ගැනීමේ නිදහස තිබේ.

මෙම විෂයයෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමේ දී මෙහි ඇතුළත් විෂය අන්තර්ගතය අර්ථාන්විත ව අධ්‍යයනය කිරීමට ඉඩ සලසා දීම ගුරු කාර්යභාරය සම්බන්ධයෙන් ඉතා වැදගත් වේ. මෙහි දී 2008 වර්ෂයේ නිකුත් කරන ලද 7 වන ශ්‍රේණියේ ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ද භාවිත කළ හැකි ය.

පුරවැසි අධ්‍යාපනය විෂයයේ අරමුණු ඉටු වන පරිදි අවම වශයෙන් 50% ක් වත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අවස්ථා සම්පාදනය කරමින් නියමිත විෂය කරුණු අධ්‍යයනයට සිසුන් යොමු කරනු ඇතැයි අපේක්ෂා කරමු. එක් එක් අපේක්ෂිත විෂය අරමුණු ඉටුකර ගැනීම සඳහා ශිෂ්‍ය පාර්ලිමේන්තුව ඵලදායී ව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්න. මෙම ගුරු මාර්ගෝපදේශය සම්බන්ධ සංවර්ධනාත්මක යෝජනා වෙතොත් අප වෙත යොමු කරන මෙන් ද කාරුණික ව ඉල්ලා සිටිමු.

ව්‍යාපෘති කමිටුව

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii-iv |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්හිමිගේ පණිවිඩය | v |
| විෂයමාලා කමිටුව | vii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | viii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | ix-xxxi |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 01-47 |
| 7.1 අපේ පවුල | 02-21 |
| 7.2 අපේ ජන සමාජය | 22-34 |
| 7.3 අපේ සංස්කෘතිය | 35-47 |
| විවිධ සහාය | 48 |

# පුරවැසි අධ්‍යාපනය

## විෂය නිර්දේශය

## 7 ශ්‍රේණිය

**(2016 සිට ක්‍රියාත්මක වේ)**

## හැඳින්වීම

1999 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා අනුව 2000 වර්ෂයේ සිට 7,8,9 ශ්‍රේණි සඳහා ජීවන නිපුණතා විෂයය ප්‍රථම වරට විෂයමාලාවට හඳුන්වා දෙන ලදී.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාවේ යෝජනා අනුව 2005 වර්ෂයේ සිට ඉතිහාසය හා සමාජ අධ්‍යයනය විෂයය වෙනුවට 6-11 ශ්‍රේණි සඳහා පුරවැසි අධ්‍යාපනය, භූගෝල විද්‍යාව හා ඉතිහාසය යන විෂයයන් හඳුන්වා දෙනු ලැබීය. ඒ වන විට ජීවන නිපුණතා විෂයය ද 7-9 ශ්‍රේණිවල ක්‍රියාත්මක විය.

2007 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂයය කොටස් ඒකාබද්ධ කර 6-9 ශ්‍රේණි සඳහා ක්‍රියාත්මක විය. 10-11 ශ්‍රේණි සඳහා පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය නමින් විෂයයේ නම වෙනස් කරන ලදී.

මේ අනුව 6-9 ශ්‍රේණිවල දී I කොටස ලෙස ජීවන නිපුණතා විෂයය ද II කොටස ලෙස පුරවැසි අධ්‍යාපනය විෂයය ද ක්‍රියාත්මක විය.

මෙසේ ක්‍රියාත්මක වීමේ දී ඇති වූ ප්‍රායෝගික ගැටලු හා ඒ වන විට කර තිබූ පර්යේෂණ අනාවරණ, ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්ගේ අදහස් ආදිය ද සලකා විෂය කොටස් දෙකක් වෙනුවට තනි විෂයයක් ලෙස ක්‍රියාත්මක කිරීම වඩාත් ඵලදායි බව හැඟෙන්නට විය.

6-9 ශ්‍රේණි සඳහා මෙම විෂයය කොටස් දෙකක් ලෙස ක්‍රියාත්මක වීම වෙනුවට විෂයය කොටස් දෙකේ අන්තර්ගතයේ සමානකම් සැලකිල්ලට ගෙන එක් විෂයයක් ලෙස ඒකාබද්ධ කර ක්‍රියාත්මක කිරීම වඩාත් යෝග්‍ය බැවින් විෂය නිර්දේශ නවීකරණය කිරීමේ දී එක් විෂයයක් ලෙස ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි විෂය නිර්දේශය නැවත සකස් කරන ලදී. සිසු පරපුර වැඩ ලෝකයට හුරු කර ගැනීමේ අරමුණින්, වෘත්තීය අධ්‍යාපනය ද තම විෂය නිර්දේශයට ඇතුළත් කර ඇත.

මේ අනුව ජීවන නිපුණතා කොටසේ තිබූ විෂය කොටස්, අවශ්‍යතාව සලකා වඩාත් යෝග්‍ය පරිදි පුරවැසි අධ්‍යාපනය විෂය කොටස සමග ඒකාබද්ධ කරන ලදී.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ නැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සුදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා



(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබා දීම.

## පුරවැසි අධ්‍යාපනය 6-11 ශ්‍රේණි විෂය අරමුණු

01. තම හැකියා දක්ෂතා විභව්‍යතා හඳුනා ගනිමින් අනාගත ජීවන ඉලක්ක ගොඩනගා ගැනීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම

02. මනා පෞරුෂයකින් යුතු ව සමාජයේ ජීවත් වීමට අවශ්‍ය නිපුණතා වර්ධනය කිරීම

03. සමාජයේ යහපැවැත්මට දායක වන සමාජ සංවිධාන හා සංස්ථා සමග එකමුතු ව කටයුතු කිරීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම

04. නිරතුරු ව වෙනස්වන ලෝකයේ අනපේක්ෂිත හා ව්‍යාකුල අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම

05. බහුවිධ සමාජයක් තුළ එක්සත්බවින් යුක්ත ව ජීවත් වීමට අවශ්‍ය මානව ගුණාංග හා සමාජ සාරධර්මවලින් යුක්ත පුරවැසියන් බිහි කිරීම

06. ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට හා මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිවලට අනුගත ව කටයුතු කරන සමාජයක් ගොඩනැගීම

07. ආපදා කළමනාකරණයට සක්‍රිය ව දායක වෙමින් ආපදා අවස්ථාවලින් වැළකීම හා සිදු වන හානි අවම කර ගැනීම

08. දේශපාලන සංකල්ප, ඒවායේ ප්‍රායෝගික භාවිත සහ ශ්‍රී ලංකාවේ හා ලෝකයේ පාලන රටා පිළිබඳ අවබෝධය ලබා දීම

09. විවිධ ආර්ථික න්‍යායන් හා විවිධ ආර්ථික මූලධර්ම විමර්ශනය කිරීම හා ඒවා සමාජ ජීවිතයට යෝග්‍ය පරිදි අදාළ කර ගැනීම

10. අන්‍යෝන්‍ය වශයෙන් වගකීම් හා යුතුකම් අගයන සමාජයක් ගොඩනැගීම

11. ශ්‍රී ලංකාවට තිරසර සාමයක් ළඟා කර ගැනීම

12. දැරිය හැකි ජීවන රටාවක් ගොඩනගා ගැනීම මගින් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනයක් ඇති කිරීම

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **අපේ පවුල**<br>7.1<br>යුතුකම් හා වගකීම් ඉටු කිරීම මගින් පවුලේ සාමාජිකයන් අතර යහපත් අන්තර්පුද්ගල සම්බන්ධතා ගොඩනගා ගනියි. | 7.1.1<br>සමාජයක කුඩා ම සහ වැදගත් ම ඒකකය පවුල බව හඳුනා ගෙන යහපත් සාමාජිකයකු ලෙස ස්ථාවර පවුල් ඒකක ගොඩනගා ගැනීමට දායක වෙයි. | • පවුල<br>• පවුල් වර්ග<br>  * න්‍යෂ්ටික පවුල<br>  * විස්තෘත පවුල<br>• පවුල තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ<br>• පවුලේ සාමාජිකයකු වශයෙන් අපට ලැබෙන ප්‍රයෝජන | • පවුල යන සංකල්පය පැහැදිලි කරයි.<br>• තම පවුල පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• පවුල් වර්ගවල වෙනස්කම් පැහැදිලි කරයි.<br>• පවුල තුළ දක්නට ඇති පොදු ලක්ෂණ ලැයිස්තුගත කරයි.<br>• පවුලේ සාමාජිකයෙකු ලෙස තමා අත් විඳින ප්‍රයෝජන විස්තර කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 7.1.2<br>පවුලේ සාමාජිකයෙකු වශයෙන්, නිවැරදි ජීවන අරමුණු ගොඩනගා ගෙන, ඒවා ඉටු කර ගැනීමට කටයුතු කරයි. | • සාර්ථක දිවි පෙවෙතකට අරමුණක් තිබීමේ වැදගත්කම<br>• එම අරමුණ කරා යොමු වන පරිදි තම ක්‍රියා පටිපාටි ප්‍රමුඛතා අනුව මෙහෙය වීම<br>• විවිධ දෑ තුළින් තමන්ට උචිත දේ කෙරෙහි පමණක් යොමු වීම | • නිවැරදි ජීවන අරමුණක් යන්න පැහැදිලි කරයි.<br>• නිවැරදි ජීවන අරමුණු ගොඩනගා ගනියි.<br>• අරමුණක් සහිත ව ජීවත් වීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• ජීවිත අරමුණු ජය ගැනීමේ ක්‍රමවේද විස්තර කරයි.<br>• විවිධ ආකර්ෂණීය දේ මගින් ජීවිතයට වඩා උචිත දේ තෝරා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි. | 02 |
| | 7.1.3<br>පවුලේ අනන්‍යතාව තහවුරු කර ගනිමින් ආත්මාභිමානය සංවර්ධනය කර ගනියි. | • තමා පිළිබඳ අභිමානයක් ඇති කර ගැනීමේ වැදගත්කම<br>• තම අනන්‍යතාව හා ගරුත්වය තමා වෙත ම රැඳී තිබීම<br>• නිරතුරු ව ම ආත්මාභිමානය හා අනන්‍යතාව සුරැකීම<br>• පවුලේ සාමාජිකයෙකු ලෙස වර්ධනය කර ගත යුතු යහපත් ගුණාංග | • තම දක්ෂතා හා සුවිශේෂී ගති ලක්ෂණ ප්‍රකාශ කරයි.<br>• තම අනන්‍යතාව හා තමා පිළිබඳ අභිමානය ගොඩ නැගෙන ආකාරය පැහැදිලි කරයි.<br>• තම අනන්‍යතාව හා ගරුත්වය තමා විසින් ම රඳවා තබා ගත යුතු බවට අදහස් දක්වයි.<br>• ආත්මාභිමානය හා අනන්‍යතාව රැක ගන්නා ආකාරය විස්තර කරයි.<br>• තම අනන්‍යතාව සුරැකීම සඳහා වර්ධනය කරගත යුතු ගුණාංග ලියා දක්වයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 7.1.4<br>පවුලේ සාමාජිකයින්ගේ ජීවිත සාර්ථකත්වයට හිතකර බලවේග අදාළ පරිදි උපයෝගි කර ගනිමින් අහිතකර බලවේගවලින් වැළකීමට කටයුතු කරයි. | • සමාජයක පවත්නා හිතකර, අහිතකර බලවේග හඳුනා ගැනීම.<br>• අහිතකර බලවේග නිසා සමාජය තුළ දක්නට ලැබෙන අයහපත් ප්‍රතිඵල විමර්ශනය කිරීම.<br>• හිතකර බලවේග නිසා සමාජය තුළ දක්නට ලැබෙන යහපත් ප්‍රතිඵල විමර්ශනය කිරීම<br>• හිතකර බලවේග ජීවිතයට ළං කර ගැනීම හා අහිතකර බලවේගවලින් ඈත් වීමට කටයුතු කිරීම | • හිතකර බලවේග හා අහිතකර බලවේග විස්තර කරයි.<br>• හිතකර බලවේගවල ප්‍රතිඵල අගය කරයි.<br>• අහිතකර බලවේගවලින් ලැබෙන අහිතකර ප්‍රතිඵල විස්තර කරයි.<br>• අහිතකර බලවේගවලින් මිදීමේ උපාය මාර්ග පැහැදිලි කරයි.<br>• හිතකර බලවේග ජීවිතයට සම්බන්ධ කර ගන්නා ආකාරය පැහැදිලි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
| --- | --- | --- | --- | --- |
| | 7.1.5<br>පවුලේ සාමාජිකයන්ගේ පෞරුෂ සංවර්ධනය උදෙසා ක්‍රීඩා හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | • සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල පවත්නා අගය<br>* විනෝදය<br>* වින්දනය<br>* චිත්තවේග ප්‍රකාශනය<br>* ජීවිතාවබෝධය<br>• විවේක අවස්ථාවල දී සංයමයෙන් යුක්ත ව නිර්මාණකරණයේ යෙදීම<br>• කාලය ඵලදායි ලෙස ගත කිරීම<br>• පවුලේ සාමාජිකයන් එක්ව එම අවස්ථා භුක්ති විඳීමට ඉඩ සලසා ගැනීම | • ක්‍රීඩාවෙන් හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වලින් ලැබෙන ප්‍රයෝජන පැහැදිලි කරයි.<br>• රසවින්දනයට යෝග්‍ය වන නිර්මාණ හා ක්‍රියාකාරකම් විස්තර කරයි.<br>• ක්‍රීඩා හා සෞන්දර්යාත්මක ක්‍රියා විවේකය ගත කිරීමට උචිත මාධ්‍ය බවට අදහස් දක්වයි.<br>• පවුලේ සාමාජිකයින් සමග ක්‍රීඩා හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල නිරතවන අයුරු විස්තර කරයි.<br>• නිර්මාණකරණයේ යෙදෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 7.1.6<br>පවුලේ සාමාජිකයකු වශයෙන් මුහුණපාන ගැටලු හා අභියෝග හමුවේ, විචාරශීලී හා නිර්මාණශීලී චින්තනයෙන් යුතු ව කටයුතු කරයි. | • එදිනෙදා ජීවිතයේ දී ඕනෑ ම පුද්ගලයෙකුට විවිධ අභියෝගවලට මුහුණ පෑමට සිදු වන බව<br>• ජීවිත අවස්ථා හා අභියෝග හමුවේ උපක්‍රමශීලි ව මෙන් ම නිර්මාණශීලී ව හා විචාරශීලී ව කටයුතු කිරීම<br>• චිත්තවේග පාලනයෙන් යුතු ව කටයුතු කිරීම හා එහි වැදගත්කම<br>• වෙනස් වන වෙළෙඳ පොළ තත්ත්ව හමුවේ විචාරශිලී ව හා බුද්ධිමත් පාරිභෝගිකයෙකු ලෙස කටයුතු කිරීමේ වැදගත්කම | • පවුලේ සමාජිකයෙකු ලෙස තමා මුහුණපාන ගැටලු හා අභියෝග විස්තර කරයි.<br>• අභියෝග හමුවේ උපක්‍රමශීලි ව, නිර්මාණශීලී ව හා විචාරශීලී ව කටයුතු කරන ආකාර පැහැදිලි කරයි.<br>• විවිධ චිත්තවේග නම් කරයි.<br>• චිත්තවේග පාලනය කළ යුතු ආකාර පහදයි.<br>• බුද්ධිමත් හා විචාරශීලී පාරිභෝගිකයකු ලෙස කටයුතු කිරීමේ වැදගත්කම විස්තර කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 7.1.7<br>පවුලේ යහපැවැත්ම සඳහා වැඩ ලෝකයේ වැදගත්කම සහ පවුලේ ආදායම් පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කර ගනියි. | පවුලකට මූල්‍යමය සුරක්ෂිතභාවයේ අවශ්‍යතාව, බොහෝ විට මව්පිය දෙදෙනාගේ එක් අයෙකු හෝ දෙදෙනා ම රැකියාවේ නිරත වෙමින් ආදායම් සපයා ගැනීම | • දිනපතා/සතිපතා/මාසික ව හොඳ ආදායමක් ලැබීමේ හෝ අඩු ආදායමක් ලැබීමේ ප්‍රතිඵල සාකච්ඡා කරයි .<br>• දෙමාපියන්ගේ රැකියා අහිමි වීම පවුලකට බලපාන ආකාරය විමර්ශනය කරයි.<br>• නව රැකියාවක් ආරම්භ කිරීමේ දී හෝ සොයා ගැනීමේ දී වෙනත් ප්‍රදේශයක ජීවත් වීමට සිදු වීම නිසා ඇති වන ආතතිය පිළිබඳ විස්තර කරයි.<br>• දෙමාපිය දෙදෙනා ම රැකියාවේ නිරත වීම නිසා නූතන පවුල් ජීවිතයට ඇති කරන පීඩනය පිළිබඳ සාකච්ඡා කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 7.1.8<br>පවුලේ සාමාජිකයෙකු ලෙස තම අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කරමින් විනයගරුක ව ජීවත් වීමට අවශ්‍ය මානව ගුණධර්ම වර්ධනය කර ගනියි. | • පවුලේ සාමාජිකයන්ගේ අයිතිවාසිකම්, යුතුකම් හා වගකීම්<br>• පවුල තුළින් බිහිවන යහපත් පුරවැසියෙකු සතු විය යුතු ගුණාංග | • පවුලෙන් තමා ට හා තමාගෙන් පවුලට ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් ප්‍රකාශ කරයි.<br>• අයිතිවාසිකම් භුක්ති විඳින අතර ඒ හා බැඳුණු යුතුකම් ඉටු කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• පවුලක් ලෙස සාමූහික ව කටයුතු කරන ආකාරය පැහැදිලි කරයි<br>• යහපත් පුරවැසියකු වීමට අවශ්‍ය ගුණාංග පවුල තුළින් ලැබෙන ආකාරය විස්තර කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 7.1.9<br>පවුල හා අසල්වාසීන් අතර අන්‍යෝන්‍ය සබඳතා තහවුරු කර ගෙන සහජීවනයෙන් ජීවත් වීමට හුරු වෙයි. | • පවුලේ සාමාජිකයන් සහ ඥාතිත්වය<br>• තම සමීප ඥාතීන් හැඳින්වීම සඳහා භාවිත කරන ඇමතුම් පද<br>• විවිධ ප්‍රදේශවල ඥාතිත්වය සඳහා භාවිත කරන ඇමතුම් පද වෙනස් වන බව<br>• පවුල තුළ ක්‍රියාත්මක වන සිරිත් විරිත්, සම්ප්‍රදායන් හා ඇගයීම් පද්ධතිය<br>* සිරිත්විරිත්<br>* සම්ප්‍රදායන්<br>• පවුල හා ඥාතීන් අතර පවත්නා සබඳතා<br>• පවුල හා අසල්වාසීන් අතර පවත්නා සබඳතාවල වැදගත්කම | • පවුලේ සාමාජිකයන් හා ඥාතිත්වය විස්තර කරයි.<br>• ඥාතිත්වය සඳහා විවිධ ප්‍රදේශවල භාවිත වන ඇමතුම් පද පිළිබඳ සාකච්ඡා කරයි.<br>• යහපත් ඥාති සම්බන්ධතා ගොඩනගා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• පවුල තුළ ක්‍රියාත්මක සිරිත්විරිත් හා සම්ප්‍රදායන් ලියා දක්වයි.<br>• තම පවුල වටා ජීවත් වන සෙසු පවුල් ඒකක අසල්වාසීන් බව ප්‍රකාශ කරයි.<br>• අසල්වාසීන් සමග යහපත් සබඳතා ගොඩ නගා ගැනීම සමාජ පැවැත්මට අත්‍යවශ්‍ය බව පැහැදිලි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **අපේ ජන සමාජය**<br>7.2<br>ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක යහපත් පුරවැසියෙකු ලෙස කටයුතු කරයි | 7.2.1<br>ජන සමාජයක පවත්නා අන්තර් සබඳතා විමර්ශනය කරයි | • සමාජය හැඳින්වීම<br>• ජන සමාජය තුළ පවතින අන්තර් සම්බන්ධතා<br>• ජන සමාජය තුළ පවත්නා සංවිධාන හා ඒ හා බැඳුණු සම්බන්ධතා | • ජන සමාජය යන්න අර්ථ දක්වයි.<br>• ජන සමාජයක මූලික හා කුඩා ම සමාජ ඒකකය පවුල බව ප්‍රකාශ කරයි.<br>• ජන සමාජයක් තුළ පවතින අන්තර් පුද්ගල සම්බන්ධතා විස්තර කරයි.<br>• ජන සමාජය තුළ පවත්නා සමාජ සංවිධාන හා බැඳුණු සම්බන්ධතා සමාජයේ යහ පැවැත්මට දායක වන බව පිළිගනිමින් අදහස් දක්වයි. | 03 |
| | 7.2.2<br>විවිධ මූලාශ්‍රයවලින් ලැබෙන දත්ත හා තොරතුරු ජන සමාජයේ යහපත පිණිස විචාරශීලී ව භාවිත කරයි. | • දත්ත හා තොරතුරු සැපයෙන මූලාශ්‍රය හඳුනා ගැනීම<br>• එම දත්ත හා තොරතුරු ජන සමාජයේ යහපතට හේතු වන අයුරින් යොදා ගැනීම<br>• එම තොරතුරු විචාරශීලී ව භාවිත කිරීමේ වැදගත්කම | • දත්ත හා තොරතුරු සැපයෙන මූලාශ්‍රය නම් කරයි.<br>• දත්ත හා තොරතුරුවල අවශ්‍යතා ව විස්තර කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • දත්ත හා තොරතුරු ජන සමාජයේ යහපතට හේතු වන බව පිළිගනිමින් අදහස් දක්වයි.<br>• දත්ත හා තොරතුරු විචාරශීලී ව භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 7.2.3<br>ජන සමාජයේ සාමාජිකයෙකු වශයෙන් නීතිමය රාමුව තුළ අයිතිවාසිකම් භුක්ති විඳීමට හුරු වෙයි. | • තමන්ට හිමිවන අයිතිවාසිකම් හඳුනා ගැනීම<br>• එම අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම්<br>• නීතිමය රාමුවක් තුළ අයිතිවාසිකම් භුක්ති විඳීමේ වැදගත්කම<br>• ජන සමාජයේ යහපත් පුරවැසියෙකු වශයෙන් ජීවත් වීම සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංග | • අයිතිවාසිකම් නිර්වචනය කරයි<br>• තමන්ට හිමි අයිතිවාසිකම් ලැයිස්තු ගත කරයි.<br>• අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් වගුගත කරයි.<br>• නීතිමය රාමුවක් තුළ අයිතිවාසිකම් භුක්ති විඳීමේ වැදගත්කම පිළිගනිමින් අදහස් දක්වයි.<br>• ජන සමාජයේ යහපත් පුරවැසියකු වශයෙන් ජීවත් වීම සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංග ලැයිස්තු ගත කරයි. | 04 |
| | 7.2.4<br>රැකියා ස්ථානයේ වෘත්තිකයන්ගේ අයිතිවාසිකම් සුරකින නීති පිළිබඳ ගවේෂණය කරයි. | • වෘත්තිකයන්ගේ අයිතිවාසිකම් සුරකින නීති<br>• රැකියා ස්ථානයේ දී ළමා ශ්‍රමය සුරාකෑම වැළැක්වීම (වැඩෙහි යෙදවිය හැකි අවම වයස)<br>• විශ්‍රාම ගැනීමේ වයස<br>• ඉටුකරන ලද කාර්යයට මූල්‍යමය ප්‍රතිලාභ සැකසීමට ඇති නීතිමය අයිතිය | • වෘත්තිකයන් ආරක්ෂා කිරීම සඳහා සමාජයේ කාර්යභාරය පැහැදිලි කරයි<br>• සමාජය තරුණයන් හා වයෝවෘද්ධයන් ආරක්ෂා කරන ආකාරය විස්තර කරයි<br>• අන්‍ය සමාජ තුළ විවිධ නීති හැදෑරීම හා ළමයින් සහ වැඩිහිටියන්ට එහි ඇති බලපෑම පිළිබඳ දැනුම්වත් වෙයි | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 7.2.5<br>ජන සමාජයේ සාමාජිකයෙකු වශයෙන් මුහුණපාන අභියෝග හමුවේ නිර්මාණශීලී ව කටයුතු කරයි. | • ජන සමාජයේ සාමාජිකයෙකු වශයෙන් මුහුණපාන අභියෝග<br>• එම අභියෝග සාර්ථක ව ජය ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග | • ජන සමාජයේ සාමාජිකයෙකු වශයෙන් මුහුණපාන අභියෝග හඳුනා ගෙන නම් කරයි<br>• අභියෝග සාර්ථක ව ජය ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග විස්තර කරයි.<br>• අභියෝගවලට සාර්ථක ව මුහුණ දීමේ අවශ්‍යතාව පුද්ගල සංවර්ධනයට හේතුවන බව පැහැදිලි කරයි. | 03 |
| | 7.2.6<br>ජන සමාජයේ යහපත උදෙසා තම යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටු කරයි. | • සමාජ යහපත සඳහා පුරවැසියෙකුගෙන් ඉටු විය යුතු යුතුකම්<br>• තම යුතුකම් ඉටු කිරීම සමාජ යහපතට හේතු වන ආකාරය | • යුතුකම් හා වගකීම් යන්න අර්ථ දක්වයි.<br>• සමාජ යහපත සඳහා පුරවැසියකුගෙන් ඉටු විය යුතු යුතුකම් නම් කරයි.<br>• නීතිමය යුතුතම් හා සදාචාරාත්මක යුතුකම් වෙන්කර දක්වයි.<br>• වගකීම් ලැයිස්තුගත කරයි.<br>• යුතුකම් ඉටු කිරීම සමාජ යහපතට හේතුවන ආකාරය විස්තර කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **අපේ සංස්කෘතිය**<br>7.3<br>බහුසංස්කෘතික සමාජයක් තුළ සාමකාමී ව යහපත් පුරවැසියෙකු ලෙස ජීවත් වෙයි | 7.3.1<br>සෑම සංස්කෘතියක ම දක්නට ලැබෙන පොදු හා විශේෂ ලක්ෂණ විශ්ලේෂණය කරයි. | • සංස්කෘතිය නිර්වචනය කිරීම<br>• සෑම සංස්කෘතියක ම දක්නට ලැබෙන පොදු ලක්‍ෂණ<br>• එක් එක් සංස්කෘතියට අනන්‍ය වූ විශේෂ ලක්‍ෂණ | • සංස්කෘතිය යන්න නිර්වචනය කරයි.<br>• සංස්කෘතික අංග නම් කරයි<br>• සෑම සංස්කෘතියක ම දක්නට ලැබෙන පොදු ලක්ෂණ පැහැදිලි කරයි.<br>• එක් එක් සංස්කෘතියට අනන්‍ය වූ විශේෂ ලක්ෂණ විස්තර කරයි. | 04 |
| | 7.3.2<br>තම සංස්කෘතික දායාද මෙන් ම අන්‍ය සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීමට දායක වෙයි. | • තම සංස්කෘතික දායාද හඳුනා ගැනීම<br>• ඒවා ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම<br>• අන්‍ය සංස්කෘතික දායාද හඳුනා ගැනීම හා ඒවාට ගරු කිරීමේ වැදගත්කම<br>• සංස්කෘතික උරුම ආරක්ෂා කිරීමට නීතිමය හා සදාචාරාත්මක වශයෙන් බැඳී සිටීම | • තම සංස්කෘතික දායාදයන් හඳුනා ගෙන නම් කරයි.<br>• තම සංස්කෘතික දායාද ආරක්ෂාකර ගත යුතු බව පැහැදිලි කරයි.<br>• අන්‍ය සංස්කෘතික දායාද හඳුනා ගෙන ඒවාට ගරු කිරීමේ වැදගත්කම පිළිගනිමින් අදහස් දක්වයි.<br>• සංස්කෘතික උරුම ආරක්ෂා කිරීමට නීතිමය හා සදාචාරාත්මක වශයෙන් බැඳී සිටීමේ වැදගත්කම විස්තර කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 7.3.3<br>ජාතික අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත නිවැරදි ව භාවිත කරමින් ඒවාට ගරු කරයි. | • ජාතික අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත<br>* ජාතික කොඩිය<br>* ජාතික ගීය<br>* රාජ්‍ය ලාංඡනය<br>* ජාතික වෘක්ෂය හා ජාතික පුෂ්පය<br>* ජාතික පක්ෂියා, ජාතික ක්‍රීඩාව<br>• ජාතික කොඩිය<br>* ඔසවන අවස්ථා<br>* නිවැරදි භාවිතය<br>* එසවීම<br>* අඩකුඹු කිරීම<br>* අනුගමනය කළ යුතු ඉරියව්<br>• ජාතික ගීය<br>* ජාතික ගීය ගායනා කරන අවස්ථා<br>* ජාතික ගීය නිවැරදි ව ගායනා කිරීම<br>* නිවැරදි ඉරියව් අනුගමනය කිරීම | • ජාතික අනන්‍යතාව පිළිබිඹු කෙරෙන සංකේත නම් කරයි.<br>• ජාතික අනන්‍යතාව පිළිබිඹු කෙරෙන සංකේතවල වැදගත්කම පැහැදිලි කරයි.<br>• ජාතික අනන්‍යතාව පිළිබිඹු කෙරෙන සංකේත නිවැරදි ව භාවිත කිරීම පිළිබඳ ව සාකච්ඡා කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 7.3.4<br>ස්වකීය සංස්කෘතික අනන්‍යතාව ආරක්‍ෂා කර ගනිමින් ජාතික සමගිය ගොඩ නැගීමට ප්‍රමුඛතාව දී කටයුතු කරයි. | • තම සංස්කෘතික අනන්‍යතාව හඳුනා ගැනීම<br>• තම සංස්කෘතික අනන්‍යතාව ආරක්‍ෂා කර ගැනීමේ වැදගත්කම<br>• තම සංස්කෘතික අනන්‍යතාව ආරක්‍ෂා කර ගනිමින් ජාතික සමගිය ගොඩනැගීම | • තම සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• තම සංස්කෘතික අනන්‍යතාව රැක ගනිමින් ජාතික සමඟිය ගොඩනැගීමේ වැදගත්කම පිළිබඳ ව අදහස් දක්වයි. | 04 |
| | 7.3.5<br>යහපත් පුරවැසියෙකු සතු සාරධර්ම අගය කරයි | • සාරධර්ම අර්ථ දැක්වීම<br>• සමාජ යහපැවැත්ම සඳහා සාරධර්මවල අවශ්‍යතාව<br>• අප විසින් සුරැකිය යුතු හා ගරු කළ යුතු සාරධර්ම<br>• පුද්ගල සංවර්ධනය සඳහා සාරධර්ම චරිතායනය කර ගැනීම | • සාරධර්ම යන්න කෙටියෙන් විස්තර කරයි.<br>• සමාජයේ යහපැවැත්ම සඳහා සාරධර්මවල අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• පුද්ගල සංවර්ධනයට අදාළ සාරධර්ම ප්‍රගුණ කර ගත යුතු බව පැහැදිලි කරයි. | 04 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# 7.1 අපේ පවුල

සමාජයේ මූලික තැනුම් ඒකකය පවුල වන අතර එය සමාජයේ වැදගත් ම ඒකකය ද වේ. පුද්ගලයා මුලින් ම සමාජීකත්වය ලබන සමාජ ඒකකය පවුල වේ. එමෙන් ම දීර්ඝ කාලයක් එහි සමාජීකත්වය දරයි. පුද්ගල සංවර්ධනයට මූලික වශයෙන් බලපාන සමාජ ඒකකය ද පවුල යි. පවුල තුළින් යහපත් සමාජිකයින් බිහි කිරීමෙන් මෙන් යහපත් සමාජ පරිසරයක් ගොඩ නැගෙයි. නූතන ලෝකයේ විවිධ සමාජ ආර්ථික වෙනස්කම්වලට මුහුණ දීමෙන් පවුල් ඒකකය ද වෙනස්වීම් රාශියකට ලක් ව ඇත. එදිනෙදා ජීවිතයේ දී සාමාජිකයින් එක් ව කටයුතු කරන හා එක් ව ගතකරන කාලය ද අඩු වී ඇත. මෙම තත්ත්වය තුළ සාමාජික සබඳතා හීන වීම, විවේකය අඩු වීම, දරුවන්ට දෙමාපිය රැකවරණය අහිමි වීම වැනි තත්ත්ව උද්ගත වී ඇත. මේ නිසා සෑම ශිෂ්‍යයෙකුට ම පවුල් ඒකකය හා එහි වැදගත්කම පිළිබඳ නිසි අවබෝධයක් ලබා දීම අවශ්‍ය වී ඇත. ඥාති සම්බන්ධතා, සිරිත්විරිත් හා සම්ප්‍රදායන් මෙන් ම අසල්වැසියන් සමග පැවැත්විය යුතු සබඳතා පිළිබඳ ව මනා වැටහීමක් ශිෂ්‍යශිෂ්‍යාවන්ට අවශ්‍ය වේ. පවුල හා අසල්වැසියන් අතර යහපත් සබඳතා පැවැත්වීම හා ප්‍රායෝගික භාවිත පිළිබඳ කුසලතා සංවර්ධනය කළ යුතු අතර ඒ සඳහා යෝග්‍ය ක්‍රියාකාරී ඉගෙනුම් අවස්ථා සම්පාදනය කිරීම ද අපේක්ෂා කෙරේ.

**නිපුණතාව**

- යුතුකම් හා වගකීම් ඉටු කිරීම මගින් පවුලේ සමාජිකයන් අතර යහපත් අන්තර්පුද්ගල සම්බන්ධතා ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම**

7.1.1 සමාජයක කුඩා ම සහ වැදගත් ම ඒකකය පවුල බව හඳුනා ගෙන යහපත් සමාජිකයෙකු ලෙස ස්ථාවර පවුල් ඒකක ගොඩනගා ගැනීමට දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02යි**

**ඉගෙනුම් පල**

- පවුල යන සංකල්පය පැහැදිලි කරයි.
- තම පවුල පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- පවුල් වර්ගවල වෙනස්කම් පැහැදිලි කරයි.
- පවුල තුළ දක්නට ඇති පොදු ලක්ෂණ ලැයිස්තුගත කරයි.
- පවුලේ සමාජිකයෙකු ලෙස තමා අත් විඳින ප්‍රයෝජන විස්තර කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- පවුල
  - සමාජයේ කුඩා ම ඒකකය වේ.
  - සමාජයේ මූලික තැනුම් ඒකකය ද වේ
- පවුල් වර්ග

**න්‍යෂ්ටික පවුල**

- මව පියා හා දරුවන්ගෙන් පමණක් සමන්විත වීම

**විස්තෘත පවුල**

- මව පියා දරුවන් හා පවුලේ ඥාතීන් එක් ව ජීවත් වේ

- පවුල තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ
  - ඥාතිත්වය මත ගොඩ නැගී තිබීම
  - න්‍යෂ්ටික පවුලකට සාපේක්ෂ ව සාමාජිකයන් වැඩි සංඛ්‍යාවකින් යුක්ත වීම
  - එක වාසස්ථානයක ජීවත් වීම
  - සමීප සබඳතා පැවතීම
  - සම්පත් බෙදා හදා ගැනීම
  - අන්‍යෝන්‍ය ව සාමාජිකයන් කෙරෙහි යහපත් ලෙස බලපෑම් කිරීම
  - පොදු යහපත අරමුණු කරගෙන කටයුතු කිරීම
  - සෙනෙහස, දයාව, ආදරය, කරුණාව පදනම් කරගෙන සාමාජිකයන් අතර සබඳතා ගොඩනැගීම

- පවුලේ සමාජිකයෙකු වශයෙන් අපට ලැබෙන ප්‍රයෝජන
    - සමාජානුයෝජනය කිරීම
    - සෙනහස හා ආදරය ලැබීම
    - ආහාර හා පෝෂණය ලැබීම
    - නිවැරදි හැසිරීම් රටා හුරු වීම
    - අධ්‍යාපනය ලැබීම
    - ආරක්ෂාව ලැබීම
    - පාරම්පරික දැනුම ලැබීම
    - සංස්කෘතිය පවරා දීම
    - නායකත්වය / නායකත්වයට ගරු කිරීම
    - සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීමට ආධාර වීම

**ගුණාත්මක යෙදවුම්**

- විස්තෘත පවුලක සාමාජිකයන් දැක්වෙන ඡායාරූපයක් හා න්‍යෂ්ටික පවුලක සාමාජිකයන් දැක්වෙන ඡායාරූපයක්
- පවුලේ සාමාජිකයෙක් ලෙස ජීවත් වීම නිසා ලැබෙන ප්‍රයෝජන විදහා දැක්වෙන ඡායාරූප

  උදාහරණ - මවක් සෙනෙහසින් දරුවකු වඩාගෙන සිටින දර්ශනයක්, පවුලේ සාමාජිකයන් එක් ව ආහාර ගැනීම දැක්වෙන දර්ශනයක්.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පවුලේ සමාජිකයන්ගේ චරිත නිරූපණය දැක්වෙන භූමිකා රංගන, විස්තෘත හා න්‍යෂ්ටික පවුල් ඒකකයේ වාසි හා අවාසි පිළිබඳ විවාද, සංවාද, පැවරුම් වැනි සුදුසු ඉගෙනුම්, ඉගැන්වීම් හා ඇගයීම් ක්‍රමවේද භාවිත කරන්න. නිර්ණායක පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

7.1.2. පවුලේ සාමාජිකයෙකු වශයෙන් නිවැරදි ජීවන අරමුණු ගොඩනගා ගෙන ඒවා ඉටුකර ගැනීමට කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාවඃ 02යි**

**ඉගෙනුම් පල**

- නිවැරදි ජීවන අරමුණක් යන්න පැහැදිලි කරයි.
- නිවැරදි ජීවන අරමුණු ගොඩනගා ගනියි.
- අරමුණක් සහිත ව ජීවත් වීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- ජීවන අරමුණු ජය ගැනීමේ ක්‍රමවේද විස්තර කරයි.
- විවිධ ආකර්ෂණීය දේ මගින් ජීවිතයට වඩා උචිත දේ තෝරා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

• සාර්ථක දිවිපෙවෙතක් සඳහා අරමුණු ඇතිකර ගැනීමේ වැදගත්කම
  - අරමුණක් මත ජීවන ඉලක්ක පිහිටුවා ගත හැකි වීම
  - උචිත අනුචිත දේ හඳුනා ගත හැකි වීම
  - උචිත අරමුණු වෙත පියවරින් පියවර ළඟා වීම
  - එමගින් තමාගේ හා තම පවුලේ ජීවන තත්ත්වය උසස් කරගත හැකි වීම

• එම අරමුණු කරා යොමු වන පරිදි තම ක්‍රියාපටිපාටි ප්‍රමුඛතා අනුව මෙහෙය වීම
  - අරමුණු තෝරා ගැනීම.
  - ක්‍රියාපටිපාටි ප්‍රමුඛතා අනුව පෙළ ගැස්වීම හා මෙහෙය වීම

උදාහරණ :-

අරමුණ - විභාගය හොඳින් සමත් වීම

• ක්‍රියාපටිපාටි ප්‍රමුඛතා අනුව පෙළ ගැස්වීම
  - දිනපතා පාසල් යාම
  - ගුරුවරුන්ට අවනත ව සිටීම
  - හොඳින් අධ්‍යාපනය ලැබීම
  - අතිරේක දැනුම් මූලාශ්‍රය සොයා යාම
  - අධ්‍යාපනයට පවුලේ සහාය ලබා ගැනීම
  - කාලසටහනකට අනුව වැඩ කිරීම

අරමුණ - විවිධ දෑ තුළින් තමන්ට උචිත දේ කෙරෙහි පමණක් යොමු වීම

• ක්‍රියාපටිපාටි ප්‍රමුඛතා අනුව පෙළ ගැස්වීම
  - යහපත් දේ හා අයහපත් දේ වෙන් කර හඳුනා ගැනීම
  - යහපත් දේ ළඟාකර ගැනීම, අයහපත් දේ අත්හැරීම

-යහපත් දේ තුළින් ද තම අරමුණට ඉතා උචිත දේ තෝරා ගැනීම

උදාහරණ- ක්‍රීඩා, සෞන්දර්ය, තාක්ෂණය වැනි ක්ෂේත්‍රවලින් තම දක්ෂතා හා ලැදියා අනුව ප්‍රමුඛතාව දීම

**ගුණාත්මක යෙදවුම්**

- ආදර්ශ චරිතාපදාන ( අරමුණ සහිත ව ජීවිතය ගොඩනගාගත් අයගේ සුදුසු චරිතාංග යොදා ගන්න.)
- ශිෂ්‍යයන් විසින් ගොඩනගන ලද ජීවන ඉලක්ක ලේඛනයක් සහ එම ඉලක්ක ජය ගැනීම සඳහා ඔවුන් යෝජනා කරන ක්‍රියාපටිපාටි  ප්‍රමුඛතා ලේඛනය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- කේවල/ කණ්ඩායම් ක්‍රියාකාරකම්
- විශිෂ්ට චරිත පිළිබඳ ශිෂ්‍යයන් රැස් කළ තොරතුරු ඇතුළත් ලිපි ආදිය නිර්ණායක මුලික ව ඇගයීම හා තක්සේරුව සඳහා යොදා ගන්න.

**නිපුණතා මට්ටම**

7.1.3. පවුලේ අනන්‍යතාව තහවුරු කර ගනිමින් ආත්මාභිමානය සංවර්ධනය කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02යි**

**ඉගෙනුම් පල**

- තම දක්ෂතා හා සුවිශේෂී ගති ලක්ෂණ ප්‍රකාශ කරයි.
- තම අනන්‍යතාව හා තමා පිළිබඳ අභිමානය ගොඩ නැගෙන ආකාරය පැහැදිලි කරයි.
- තම අනන්‍යතාව හා ගරුත්වය තමා විසින් ම රඳවා තබා ගත යුතු බවට අදහස් දක්වයි.
- ආත්මාභිමානය හා අනන්‍යතාව රැක ගන්නා ආකාරය විස්තර කරයි.
- තම අනන්‍යතාව සුරැකීම සඳහා වර්ධනයකර ගත යුතු ගුණාංග ලියා දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- තමා පිළිබඳ අභිමානයක් ඇතිකර ගැනීමේ වැදගත්කම
- තමා තුළ ඇති යහපත් හා සුවිශේෂී ගති ලක්ෂණ ඉස්මතු කර ගත හැකි වීම
- දුබලතා මගහැර ගැනීමට පෙලඹීම
- අන් අයගේ ඇගයීමට ලක්වීම

- තම අනන්‍යතාව හා ගරුත්වය තමා වෙත රැඳී තිබීම
  - වටිනාකම්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම්, අවශ්‍යතා තේරුම් ගැනීම
  - ගති ලක්ෂණ, හැසිරීම් රටා දක්ෂතා දියුණු කර ගැනීම
  - තමා පිළිබඳ ඇගයීම තමා විසින් ම සිදු කිරීම

- නිරතුරු ව ම ආත්මාභිමානය හා අනන්‍යතාව සුරැකීම
  - පිළිගැනීමට හා දියුණුවට පත්වන ආකාරයෙන් කටයුතු කිරීම
  - යහපත් දේ පිළිගැනීම හා අයහපත් දේ උචිත පරිදි ප්‍රතික්ෂේප කිරීම
  - තමාට ගැළපෙන දේ තෝරා ගැනීම

- පවුලේ සාමාජිකයෙකු ලෙස වර්ධනය කරගත යුතු යහපත් ගුණාංග
  - ආදරය, සෙනෙහස, කරුණාව හා දයාව
  - ඉවසීම
  - සහයෝගය
  - අවංක බව
  - සුහද බව
  - ස්වයං විනය
  - පවුලේ දියුණුවට කැපවීම

**ගුණාත්මක යෙදවුම්**

- ශිෂ්‍යශිෂ්‍යාවන් විසින් පෞද්ගලික ව / කණ්ඩායම් ලෙස සකස් කළ තමා තුළ ඇති හොඳ ගති ලක්ෂණ ඇතුළත් පත්‍රිකාවක්
- තමාගේ දුර්වල ගති ලක්ෂණ ඇතුළත් පත්‍රිකාවක්
- පාසල් ශිෂ්‍යයෙක් ලෙස වර්ධනය කර යුතු ගුණාංග ඇතුළත් පත්‍රිකාවක්
  (පාඩම ක්‍රියාත්මක වන දිනයට පෙර මේවා සකස් කර ගැනීමට උපදෙස් දෙන්න)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

කේවල හෝ කණ්ඩායම් පැවරුම්, පොස්ටර් නිර්මාණ, චරිතාපදාන ඇසුරින් යහපත් ගුණාංග හඳුනා ගැනීමට සැලැස්වීම වැනි ක්‍රමවේද භාවිත කර සුදුසු නිර්ණායක මත ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

7.1.4 පවුලේ සාමාජිකයන් ගේ ජීවිත සාර්ථකත්වයට හිතකර බලවේග අදාළ පරිදි උපයෝගි කර ගනිමින් අහිතකර බලවේගවලින් වැළකීමට කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02යි**

**ඉගෙනුම් පල**

- හිතකර බලවේග හා අහිතකර බලවේග විස්තර කරයි.
- හිතකර බලවේගවල ප්‍රතිඵල අගය කරයි.
- අහිතකර බලවේගවලින් ලැබෙන අහිතකර ප්‍රතිඵල විස්තර කරයි.
- අහිතකර බලවේගවලින් මිදීමේ උපාය මාර්ග පැහැදිලි කරයි.
- හිතකර බලවේග ජීවිතයට සම්බන්ධ කර ගන්නා ආකාරය පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- සමාජයක පවත්නා හිතකර, අහිතකර බලවේග හඳුනා ගැනීම
  - හිතකර බලවේග

    උදාහරණ :- නිවස, පාසල, පන්සල, පල්ලිය ඇසුරෙන් ලැබෙන යහපත් ආදර්ශ කලණ මිතුරු ඇසුර, හොඳ පොත පත, හොඳ මාධ්‍ය වැඩසටහන්
  - අහිතකර බලවේග

    උදාහරණ :- දුම්වැටි, මත් ද්‍රව්‍ය, නුසුදුසු පොත්පත්, නුසුදුසු වීඩියෝ දර්ශන, වැරදි මගට යොමු වූ මිතුරු/මිතුරියන්

- අහිතකර බලවේග නිසා සමාජය තුළ දක්නට ලැබෙන අයහපත් ප්‍රතිඵල විමර්ශනය කිරීම
  - කායික හා මානසික වශයෙන් ලෙඩ වීම
  - සොරකම්, ජීවිත හානි, දේපල විනාශ වීම
  - අපරාධකරුවන්, සොරුන්, මිනීමරුවන්, ත්‍රස්තවාදීන්, ජාවාරම්කරුවන් වැනි අය බිහි වීම
- හිතකර බලවේග නිසා සමාජය තුළ දක්නට ලැබෙන යහපත් ප්‍රතිඵල විමර්ශනය කිරීම

  උදාහරණ :-
  - පුද්ගල සංවර්ධනයට යෝග්‍ය පොතපත ඇසුරු කිරීම තුළින් ජීවිතය යහපත් වීම
  - පාසල, පන්සල, කෝවිල, මස්ජිදය, පල්ලිය, පුස්තකාලය වැනි ආයතනවලින් සිදු වන සේවා පුද්ගල සංවර්ධනයට හේතු වීම
  - ඵලදායි මාධ්‍ය වැඩසටහන් පුද්ගල හා සමාජ සංවර්ධනයට හේතු වීම
- හිතකර බලවේග ජීවිතයට ළඟා කර ගැනීම හා අහිතකර බලවේගවලින් ඈත් වීමට කටයුතු කිරීම
  - හිතකර බලවේග ජීවිතයට ළං කර ගතහැකි ආකාර
  - අහිතකර බලවේගවලින් ඈත් වීමේ ක්‍රමවේද

**ගුණාත්මක යෙදවුම්**

- පුවත්පත්වල පළවන රූපවාහිනී වැඩසටහන් විස්තර ඇසුරින් පාසල් ශිෂ්‍යශිෂ්‍යාවන්ට නැරඹීමට වඩාත් උචිත වැඩසටහන් ලේඛනයක්. (සපයා ගත් වැඩසටහන් විස්තර ඇසුරින් සුදුසු වැඩසටහන් තෝරා බේරා ගැනීමට සිසුන්ට මඟ පෙන්වන්න)
- හිතකර බලවේග ඇසුරු කිරීම නිසා ජීවිත සාර්ථක කරගත් අය පිළිබඳ විස්තර.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මේ සඳහා සුදුසු ක්‍රමවේද භාවිත කර නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

7.1.5 පවුලේ සාමාජිකයන්ගේ පෞරුෂ සංවර්ධනය උදෙසා ක්‍රීඩා හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල නිරත වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02යි**

**ඉගෙනුම් පල**

- ක්‍රීඩාවෙන් හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වලින් ලැබෙන ප්‍රයෝජන පැහැදිලි කරයි.
- රසවින්දනයට යෝග්‍ය වන නිර්මාණ හා ක්‍රියාකාරකම් විස්තර කරයි.
- ක්‍රීඩා හා සෞන්දර්යාත්මක ක්‍රියා විවේකය ගතකිරීමට උචිත මාධ්‍ය බවට අදහස් දක්වයි.
- පවුලේ සාමාජිකයින් සමග ක්‍රීඩා හා සෞන්දර්‍යාත්මක ක්‍රියාකාරකම්වල නිරත වන අයුරු විස්තර කරයි.
- නිර්මාණකරණයේ යෙදෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- සෞන්දර්යාත්මක ක්‍රියාකරකම් හා ක්‍රීඩාවල පවත්නා අගය
  - විනෝදය
  - වින්දනය
  - චිත්තවේග ප්‍රකාශය
  - ජීවිතාවබෝධය

- විවේක අවස්ථාවල දී සංයමයෙන් යුක්ත ව නිර්මාණකරණයේ යෙදීම
  - නිර්මාණකරණය මගින් ජීවන අවස්ථා සෞන්දර්යාත්මක ව දැකිය හැකි බව
  - කාලය ඵලදායි ලෙස ගත කිරීම
  - අර්ථවත් විනෝදාංශවල යෙදීම

- පවුලේ සාමාජිකයන් එක් ව එම අවස්ථා, භුක්ති විඳීමට ඉඩ සලසා ගැනීම
  - ගීත ගායනය
  - ක්‍රීඩාවල නිරත වීම

**ගුණාත්මක යෙදවුම්**

තෝරාගත් අර්ථවත් ගීත ඇතුළත් සංයුක්ත තැටි, ගෘහස්ථ ක්‍රීඩා, ජන ක්‍රීඩා පිළිබඳ තොරතුරු ඇතුළත් පත්‍රිකා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ක්‍රියාකාරී ඉගෙනුම් අවස්ථාවලට ඉඩ සලසා ශිෂ්‍යශිෂ්‍යාවන් ඉගෙනීමෙහි නිරත වන අතරතුර නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණයෙහි යෙදෙන්න.

**නිපුණතා මට්ටම**

7.1.6 පවුලේ සාමාජිකයෙකු වශයෙන් මුහුණ පාන ගැටලු හා අභියෝග හමුවේ, විචාරශීලි හා නිර්මාණශීලි චින්තනයෙන් යුතු ව කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02යි**

**ඉගෙනුම් පල**

- පවුලේ සමාජිකයෙකු ලෙස තමා මුහුණපාන ගැටලු හා අභියෝග විස්තර කරයි.
- අභියෝග හමුවේ උපක්‍රමශීලි ව, නිර්මාණශීලී ව හා විචාරශීලී ව කටයුතු කරන ආකාර පැහැදිලි කරයි.
- විවිධ චිත්තවේග නම් කරයි.
- චිත්තවේග පාලනය කළ යුතු ආකාර පැහැදිලි කරයි
- බුද්ධිමත් හා විචාරශීලී පාරිභෝගිකයකු ලෙස කටයුතු කිරීමේ වැදගත්කම විස්තර කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- එදිනෙදා ජීවිතයේ දී ඕනෑ ම පුද්ගලයකුට විවිධ අභියෝගවලට මුහුණ පෑමට සිදුවන බව
  - ජීවත් වීම යනු අභියෝගවලට මුහුණ දීමකි

  උදාහරණ:- - පවුලේ සාමාජිකයන්ගේ කාර්ය බහුලතාව
  - පුද්ගල ආකල්ප විවිධ වීම
  - විවිධ චිත්තවේග තත්ත්ව
  - දෙමාපියන් රට යෑම, විවේකය අඩුකම
- ජීවිත අවස්ථා හා අභියෝග හමුවේ උපක්‍රමශීලී ව කටයුතු කිරීම
  - දකින, ඇසෙන දේවල් දෙස විවිධ කෝණවලින් බැලීමට පුරුදු වීම
- චිත්තවේග පාලනයෙන් යුතු ව කටයුතු කිරීම හා එහි වැදගත්කම
  - පුද්ගලයා තුළ ඇතිවන විවිධ චිත්තවේග හැඳින්වීම

  උදාහරණ :- - සතුට, කරුණාව, ක්ෂණික කෝපය
  - යහපත් චිත්තවේග මෙන් ම අයහපත් චිත්වේග ද පුද්ගයා තුළ ඇති විය හැකි බව
  - අයහපත් චිත්තවේග ක්‍රියාත්මක වීම යහපත් අන්තර්පුද්ගල සම්බන්ධතා මෙන් ම සමාජයේ යහපැවැත්මට ද හානිකර වන බව
  - චිත්තවේග පාලනය කර ගැනීම යහපත් අන්තර්පුද්ගල සම්බන්ධතා මෙන් ම සමාජයේ යහපැවැත්මට ද හේතු වන බව
- චිත්තවේග පාලනය සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග

  උදාහරණ :- - ආගමික වත්පිළිවෙත්වල යෙදීම සහ භාවනා කිරීම, සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් වල නිරත වීම
  - ක්‍රීඩාවල යෙදීම
- වෙනස්වන වෙළෙඳ පොළ තත්ත්ව හමුවේ විචාරශීලී ව හා බුද්ධිමත් පාරිභෝගිකයෙකු ලෙස කටයුතු කිරීමේ වැදගත්කම

- විචාරශීලී ව හා බුද්ධිමත් පාරිභෝගිකයෙකු ලෙස වෙළෙඳ පොළ තුළ කටයුතු කිරීමේ දී
  සැලකිලිමත් විය යුතු කරුණු
  - පවතින වෙළෙඳ පොළ තත්ත්ව
  - භාණ්ඩයේ ප්‍රමිතිය
  උදාහරණ - SLS සහතිකය, ISO තත්ත්ව සහතිකය
  - සෞඛ්‍යාරක්ෂිත බව
  - භාණ්ඩයේ ගුණාත්මක බව
  - උපරිම සිල්ලර මිල
  - අඩංගු ද්‍රව්‍ය
  - සමාන භාණ්ඩවල වෙළෙඳපොළ මිල ගණන් හා සැසඳීම
  - ආදේශක භාණ්ඩ
  - නිෂ්පාදිත දිනය මෙන් ම කල් ඉකුත්වන දිනය
  - එළවළු හා පලතුරු වැනි දෑ මිල දී ගැනීමේ දී නැවුම් බව, ආයු කාලය දිර්ඝ කර ගැනීම සඳහා රසායනික ද්‍රව්‍ය එක්කර ඇත්දැයි සොයා බැලීම

**ගුණාත්මක යෙදවුම්**

පුද්ගලයන් එදිනෙදා ජීවිතයේ දී මුහුණපාන අභියෝග පිළිබඳ තෝරාගත් සුදුසු සිද්ධි ශිෂ්‍යාශිෂ්‍යාවන් මුහුණ පෑ අභියෝග පිළිබඳ තොරතුරු

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

සිද්ධි අධ්‍යයන, පැවරුම්, භූමිකා රංගන වැනි ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් විෂය කරුණු අධ්‍යයනයට අවස්ථාව සලසා නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

7.1.7 පවුලේ යහපැවැත්ම සඳහා වැඩ ලෝකයේ වැදගත්කම සහ පවුලේ ආදායම් පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 04යි.**

**ඉගෙනුම් පල**

- දිනපතා හෝ සතිපතා හෝ මාසික ව හොඳ ආදායමක් ලැබීමේ හෝ අඩු ආදායමක් ලැබීමේ ප්‍රතිඵල සාකච්ඡා කරයි .
- දෙමාපියන්ගේ රැකියා අහිමි වීම පවුලකට බලපාන ආකාරය විමර්ශනය කරයි.
- නව රැකියාව ආරම්භ කිරීමේ දී හෝ සොයා ගැනීමේ දී වෙනත් ප්‍රදේශයක ජීවත් වීමට සිදු වීම නිසා ඇති වන ආතතිය පිළිබඳ විස්තර කරයි.
- දෙමාපියන් දෙදෙනා ම රැකියාවේ නිරත වීම නිසා නූතන පවුල් ජීවිතයට ඇති කරන පීඩනය පිළිබඳ සාකච්ඡා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- පවුලකට මූල්‍යමය සුරක්ෂිතභාවයේ අවශ්‍යතා ව බොහෝ විට මව්පියන් දෙදෙනාගෙන් එක් අයෙකු හෝ දෙදෙනා ම රැකියාවේ නිරත වෙමින් ආදායම් උපයා ගැනීම
  - දිනපතා/සතිපතා/මාසික ව ආදායම් ලැබෙන රැකියාවක නියුතු වීම
  - පවුලේ පැවැත්ම හා අභිවෘද්ධිය සඳහා ප්‍රමාණවත් ආදායමක් ලැබෙන රැකියාවක නියුතු වීම
  - ප්‍රමාණවත් ආදායමක් ලැබීමේ ප්‍රතිඵල හෝ අවාසි
  - පවුලේ පැවැත්ම සඳහා ප්‍රමාණවත් ආදායමක් නොලැබීමේ ප්‍රතිඵල හෝ අවාසි
- දෙමාපියන්ගේ රැකියා අහිමිවීමක් සිදු වුවහොත් එයින් පවුලට ඇති වන බලපෑම්
- රැකියාවක් ලැබීමත් සමඟ හෝ නව රැකියාවක් සොයා ගැනීමේ දී පදිංචි ස්ථානයෙන් දුර ප්‍රදේශයකට යාමට සිදු වීම නිසා ඇති වන ආතතිය
  - රැකියාව හේතුවෙන් මව හෝ පියා පවුලෙන් බැහැර වීම නිසා පවුලට ඇති කරන බලපෑම්
  - රැකියාවක් සඳහා මව හෝ පියා විදේශ ගත වීම නිසා ඇති විය හැකි බලපෑම්
- මව හා පියා යන දෙදෙනා ම රැකියාවන්හි නියුතු වීම නිසා නූතන පවුල් ඒකකයට ඇති කරන පීඩනය
  - දරුවන් බලා ගැනීම සඳහා බාහිර අය යෙදවීම හා ඒ වෙනුවෙන් ගෙවීම් කිරීම

**ගුණාත්මක යෙදවුම්**

දිනපතා හෝ සතිපතා හෝ මාසික ව ගෙවීම් කරන විවිධ රැකියා පිළිබඳ විස්තර ඇතුළත් පත්‍රිකා, මව්පිය දෙදෙනා ම රැකියාවේ නියුතු වීම නිසා පවුලට ඇති කරන බලපෑම් පිළිබඳ පළ වී ඇති පුවත් පත් වාර්තා, සිද්ධි අධ්‍යයන

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මව්පියන් රැකියාවල නිරත වීමෙන් ඇති ආර්ථික සුරක්ෂිතභාවය හා ඒ නිසා පවුලකට ඇති විය හැකි බලපෑම් පිළිබඳ ව තොරතුරු රැස්කර වාර්තාවක් සකස් කිරීමට සලස්වා (කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස) නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

7.1.8 පවුලේ සාමාජිකයකු ලෙස තම අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කරමින් විනය ගරුක ව ජීවත් වීමට අවශ්‍ය මානව ගුණධර්ම වර්ධනය කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02යි.**

**ඉගෙනුම් පල**

- පවුලෙන් තමාට හා තමාගෙන් පවුලට ඉටු විය යුතු යුතුකම් හා වගකීම් ප්‍රකාශ කරයි.
- අයිතිවාසිකම් භුක්ති විඳින අතර ඒ හා බැඳුණු යුතුකම් ඉටු කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- පවුලක් ලෙස සාමුහික ව කටයුතු කරන ආකාරය පැහැදිලි කරයි.
- යහපත් පුරවැසියකු වීමට අවශ්‍ය ගුණාංග පවුල තුළින් ලැබෙන ආකාරය විස්තර කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- පවුලේ සාමාජිකයන්ගේ අයිතිවාසිකම්, යුතුකම් හා වගකීම්
  - අයිතිවාසිකම්
    - රැකවරණය ලැබීම
    - අධ්‍යාපනය ලැබීම
    - ආහාර හා පෝෂණය ලැබීම
  - යුතුකම් හා වගකීම්
    - නායකත්වයට ගරු කිරීම
    - පවුලට අයත් දේ ආරක්ෂා කිරීම
    - පවුලේ ගෞරවය ආරක්ෂා කිරීම
- පවුල තුළින් බිහිවන යහපත් පුරවැසියකු සතු විය යුතු ගුණාංග
    - විනයගරුක වීම හා ශික්ෂණය
    - නායකත්වයට ගරු කිරීම
    - පොදු දේපළ ආරක්ෂා කිරීම
    - සහයෝගය
    - ඉවසීම
    - අන්මත ගරු කිරීම
    - සාකච්ඡා මගින් තීරණවලට එළඹීම
    - එදිනෙදා කාර්යයන් ඉටුකර ගැනීමට හැකි සෑම විට ම තම දායකත්වය ලබා දීම

**ගුණාත්මක යෙදවුම්**

මෙහි දැක්වෙන විෂය අන්තර්ගතයට අදාළ කරුණු නියෝජනය වන ඡායාරූප (උදාහරණ - දෙමාපිය රැකවරණය ලබන අවස්ථා, ආහාර ගන්නා අවස්ථා, අධ්‍යාපන කටයුතු සඳහා දෙමාපිය සහාය ලබන අවස්ථා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

අපේක්ෂිත ඉගෙනුම් පල සාධනය වුවා දැයි මැන බැලීම සඳහා නිර්ණායක මුලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

7.1.9 පවුල හා අසල්වාසීන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා තහවුරු කරගෙන සහජීවනයෙන් ජීවත් වීමට හුරු වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02යි.**

**ඉගෙනුම් පල**

- පවුලේ සාමාජිකයන් හා ඥාතිත්වය විස්තර කරයි.
- ඥාතිත්වය සඳහා විවිධ ප්‍රදේශවල භාවිත වන ඇමතුම් පද සාකච්ඡා කරයි.
- යහපත් ඥාති සම්බන්ධතා ගොඩනගා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- පවුල තුළ ක්‍රියාත්මක සිරිත්විරිත් හා සම්ප්‍රදායන් ලියා දක්වයි.
- තම පවුල වටා ජීවත් වන සෙසු පවුල් ඒකක අසල්වාසීන් බව ප්‍රකාශ කරයි.
- අසල්වාසීන් සමග යහපත් සබඳතා ගොඩනගා ගැනීම සමාජ පැවැත්මට අත්‍යවශ්‍ය බව පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- පවුලේ සාමාජිකයන් සහ ඥාතිත්වය
- තම සමීප ඥාතීන් හැඳින්වීම සඳහා භාවිත කරන ඇමතුම් පද
  - මව් පාර්ශ්වයේ ඥාතීන්
  - පිය පාර්ශ්වයේ ඥාතීන්
- විවිධ ප්‍රදේශවල ඥාතිත්වය සඳහා භාවිත කරන ඇමතුම් පද වෙනස් වන බව

උදාහරණ ඃ- සීයා - ආතා, මුත්තා
තාත්තා - අප්පච්චි, අප්පුච්චා
පුංචි අම්මා - පොඩි අම්මා, බාලම්මා

- පවුල තුළ ක්‍රියාත්මක වන සිරිත්විරිත්, සම්ප්‍රදායන් හා ඇගයීම් පද්ධතිය

**සිරිත්**

උදාහරණ ඃ- ගෙට ගෙවැදීම
ඉඳුල් කටගෑම
අකුරු කියවීම

**විරිත්**

උදාහරණ ඃ- - සිංහල/හින්දු අලුත් අවුරුදු චාරිත්‍ර අනුව නොනගත කාලයේ ආහාර ගැනීමෙන් වැළකීම
- ලිප ගිනි මෙලවීමෙන් වැළකීම

(විවිධ සංස්කෘතීන්ට අනුව සිරිත්විරිත් සම්ප්‍රදායන්, ඇගයීම් පද්ධති වෙනස් විය හැකි ය. අදාළ පරිදි උදාහරණ සපයන්න.)

උදාහරණ :- වැඩිහිටියන්ට සැලකීම
ආගන්තුක සත්කාරය
සිරිත්විරිත් පවත්වා ගෙන යාම

- පවුල හා ඥාතීන් අතර පවතින සබඳතා.

උදාහරණ - ආගමික කටයුතු, නිවෙස්වල පැවැත්වෙන පොදු උත්සව, මංගල උත්සව, අවමංගල උත්සව ආදියට සම්බන්ධ වීම

- පවුල හා අසල්වාසීන් අතර පවත්නා සබඳතාවල වැදගත්කම
  - පුද්ගලයකුට හෝ පවුලකට තනි ව තම අවශ්‍යතා ඉටුකර ගැනීම අපහසු වීම
  - අසල්වාසි සහාය නිතර අවශ්‍ය වීම
  - අන්‍යෝන්‍ය සහයෝගය වර්ධනය වීම
  - විශ්වාසය හා සහයෝගය තහවුරු වීම

**ගුණාත්මක යෙදවුම්**

පවුලේ ආසන්නම ඥාතීන්ගේ ඥාතිත්වය පෙන්නුම් කරන සටහනක්, පවුල්වල අනුගමනය කරන සිරිත්විරිත්, සම්ප්‍රදායන් දැක්වෙන පෝස්ටර් ආදිය යොදා ගන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

අපේක්ෂිත ඉගෙනුම් පල සාධනය වුවා දැයි මැන බැලීම සඳහා නිර්ණායක මුලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

## නිදර්ශක ක්‍රියාකාරකම

**නිපුණතාව** - යුතුකම් හා වගකීම් ඉටු කිරීම මගින් පවුලේ සමාජිකයන් අතර යහපත් අන්තර්පුද්ගල සම්බන්ධතා ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම** - සමාජයක කුඩා ම සහ වැදගත් ම ඒකකය පවුල බව හඳුනා ගෙන යහපත් සමාජිකයෙකු ලෙස ස්ථාවර පවුල් ඒකක ගොඩනගා ගැනීමට දායක වෙයි.

**ඉගෙනුම් පල** - • පවුල් වර්ගවල වෙනස්කම් පැහැදිලි කරයි.

**ක්‍රියාකාරකම** - " පවුල් වර්ග හඳුනා ගනිමු "

**කාලය** - මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** - න්‍යෂ්ටික පවුලක සාමාජිකයන් දැක්වෙන ඡායාරූපයක්/චිත්‍රයක්
විස්තෘත පවුලක සාමාජිකයන් දැක්වෙන ඡායාරූපයක්/චිත්‍රයක්
බ්‍රිස්ල් බෝඩ්, ෆෙල්ට් පෑන්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර I**

- මව, පියා දරුවන්ගෙන් සමන්විත පවුලක ඡායාරූපයක්/චිත්‍රයක් පන්තියට ඉදිරිපත් කර එහි සමාජිකයන් හඳුනා ගැනීමට ශිෂ්‍යශිෂ්‍යායවන් යොමු කරන්න.
- එම පවුල් ඒකකයේ සාමාජිකයන් අතර පවත්නා ඥාතීත්වය පිළිබඳ ශිෂ්‍යශිෂ්‍යායවන් සමඟ සාකච්ඡා කරන්න.
- න්‍යෂ්ටික පවුලක ලක්ෂණ ශිෂ්‍යශිෂ්‍යායවන් සමඟ සාකච්ඡා කරන්න.
- එවන් පවුලක් න්‍යෂ්ටික පවුලක් ලෙස හැඳින්වෙන බව පැහැදිලි කරන්න.
- මව, පියා, දරුවන්, ආච්චි, සීයා, නැන්දා, බාප්පා වැනි සමාජිකයන්ගෙන් සමන්විත පවුලක ඡායාරූපයක් ප්‍රදර්ශනය කරන්න.
- විස්තෘත පවුලක ලක්ෂණ ශිෂ්‍යශිෂ්‍යායවන් සමඟ සාකච්ඡා කරන්න.
- මෙවන් සාමාජිකයන්ගෙන් සමන්විත පවුලක් විස්තෘත පවුලක් ලෙස හැඳින්වෙන බව ශිෂ්‍යශිෂ්‍යායවන් සමඟ සාකච්ඡා කරන්න.

**පියවර II**

සුදුසු පරිදි පන්තියේ ශිෂ්‍යශිෂ්‍යායවන් කණ්ඩායම් කරන්න.
එක් එක් කණ්ඩායමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා දෙන්න.
පහත දැක්වෙන කාර්යයන් නිම කිරීමට කණ්ඩායම්වලට උපදෙස් ලබා දෙන්න.

- න්‍යෂ්ටික පවුලක හා විස්තෘත පවුලක සමාජිකත්වය චිත්‍ර මඟින් නිරූපණය කරන්න.
- එම චිත්‍රයෙන් දැක්වෙන සාමාජිකයන් අතර ඥාතිත්වය දක්වන්න.
- පවුලේ සාමාජිකයෙක් ලෙස ජීවත් වීම නිසා තමන් අත්විඳින ප්‍රයෝජන සටහන් කරන්න.
- කාර්යය නිම කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම සිදු කරන්න. ශිෂ්‍ය නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**පියවර III** ඉහත දක්වන ලද ඉගෙනුම් පල සාධනය වන පරිදි කණ්ඩායම් විසින් ඉදිරිපත් කළ තොරතුරු ඇසුරින් සමාලෝචනයක යෙදෙන්න. පහත දැක්වෙන නිර්ණායක පදනම් කරගෙන ඇගයීම් හා තක්සේරුකරණය කරන්න.

**ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක**

- විස්තෘත පවුලක හා න්‍යෂ්ටික පවුලක ලක්ෂණ විස්තර කරයි
- පවුලේ සමාජිකයන් අතර පවත්නා ඥාතිත්වය පැහැදිලි කරයි.
- පවුලේ සමාජිකයන් ලෙස ජීවත් වීම නිසා අත් විඳින ප්‍රයෝජන විස්තර කරයි.
- නියමිත කාලය තුළ අදාළ කාර්යය නිම කරයි.
- කණ්ඩායම් හැඟීමෙන් යුතු ව කටයුතු කරයි.

## 7.2 අපේ ජන සමාජය

පවුල් ඒකක රාශියක් එක් වීමෙන් සමාජයක් නිර්මාණය වේ. සමාජය තුළ විවිධතා ඇත. විවිධ වූ මිනිස් අවශ්‍යතා මුලික කරගෙන විවිධ සමාජ සංවිධාන ගොඩනැගී ඇත.

සමාජයේ යහපැවැත්ම සඳහා අයිතිවාසිකම් භුක්ති විදිමින් යුතුකම් හා වගකීම් ඉටු කිරීම අවශ්‍ය වේ. වර්තමාන සමාජයේ පුරවැසියන් යුතුකම් හා වගකීම් පැහැර හරිමින් අයිතිවාසිකම් ඉල්ලීමට යාමෙන් විවිධ ගැටලු පැන නැගී ඇත.

සදාචාරාත්මක හා නීතිමය තත්ත්ව යටතේ තම යුතුකම් හා වගකීම් ඉටු කරමින් නීතිමය රාමුව ආශ්‍රයෙන් අයිතිවාසිකම් භුක්ති විඳීම සමාජ යහපතට ඉතා වැදගත් වේ. සමාජ ප්‍රගමනයට දායකවන සමබර පෞරුෂත්වයකින් යුත් යහපත් පුරවැසියකු බිහි කිරීමට අවශ්‍ය නිපුණතා සංවර්ධනය කිරීම සඳහා මග පෙන්වීම මෙම ඒකකය අධ්‍යයනය කිරීමෙන් අපේක්ෂා කෙරේ.

**නිපුණතා මට්ටම**

ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක යහපත් පුරවැසියකු ලෙස කටයුතු කරයි.

**නිපුණතා මට්ටම**

7.2.1 ජන සමාජයක පවත්නා අන්තර් සම්බන්ධතා විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාවඃ 03**

**ඉගෙනුම් පල**

- ජන සමාජය යන්න අර්ථ දක්වයි.
- ජන සමාජයක මූලික හා කුඩා ම සමාජ ඒකකය පවුල බව ප්‍රකාශ කරයි.
- ජන සමාජය තුළ පවතින අන්තර්පුද්ගල සම්බන්ධතා විස්තර කරයි.
- ජන සමාජය තුළ පවත්නා සමාජ සංවිධාන හා බැඳුණු සම්බන්ධතා සමාජයේ යහ පැවැත්මට දායක වන බව පිළිගනිමින් අදහස් දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- ජන සමාජය හැඳින්වීම
    - ජන සමාජය හැඳින්වීම
    - ජන සමාජය තුළ ඇති අන්තර් සම්බන්ධතා

උදාහරණ ඃ- - දෙමාපිය, දූ දරුවන් අතර
- ගුරුවරුන්, ශිෂ්‍යශිෂ්‍යායවන් අතර
- අසල්වැසියන් අතර
- සමජයේ ඇති ආයතන, සමිති සමාගම්, සංවිධාන හා ආගමික ආයතන අතර

- ජන සමාජය තුළ පවත්නා විවිධ සංවිධාන

උදාහරණ ඃ- - ආගමික සංවිධාන
- ග්‍රාම සංවර්ධන සමිති
- ක්‍රීඩා සංවිධාන
- යෞවන සමිති
- මහිලා සමිති / කාන්තා සමිති

- මෙවැනි සංවිධාන හා බැඳුණු සම්බන්ධතා පිළිබඳ ව ශිෂ්‍යශිෂ්‍යායවන් සමග සාකච්ඡා කරන්න

**ගුණාත්මක යෙදවුම්**

සමාජය පිළිබඳ ලියවුණු නිර්වචන, සමාජයේ ඇති විවිධ සමිති, සමාගම් ආගමික ආයතන සම්බන්ධ ඡායාරූප තොරතුරු හා විස්තර පත්‍රිකා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ජන සමාජය තුළ පවත්නා අන්තර්සම්බන්ධතා හා සංවිධාන පිළිබඳ තොරතුරු ඇතුළත් පැවරුමක් කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගෙන සුදුසු නිර්ණායක ඔස්සේ ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

7.2.2 විවිධ මූලාශ්‍රවලින් ලැබෙන දත්ත හා තොරතුරු ජන සමාජයේ යහපත පිණිස විචාරශීලී ව භාවිත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 03 යි.**

**ඉගෙනුම් පල**

- දත්ත හා තොරතුරු සැපයෙන මූලාශ්‍රය නම් කරයි.
- දත්ත හා තොරතුරුවල අවශ්‍යතාව විස්තර කරයි.
- දත්ත හා තොරතුරු ජන සමාජයේ යහපතට හේතු වන බව පිළිගනිමින් අදහස් දක්වයි.
- දත්ත හා තොරතුරු විචාරශීලී ව භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

දත්ත හා තොරතුරු සැපයෙන මූලාශ්‍රය

උදාහරණ - පොත්පත්, පුවත්පත්, සඟරා, වීඩියෝ පට, ගුවන් විදුලිය, රූපවාහිනී, වී.සී.ඩී. පට, විශ්ව කෝෂ, පරිගණකය, අන්තර්ජාලය

දත්ත හා තොරතුරුවල අවශ්‍යතාව

උදාහරණ:- - විවිධ ජීවිත අවස්ථාවලට හා සිද්ධිවලට මුහුණ දීමට සිදු වීම
එහි දී තමා සතු අත්දැකීම් තමා සතු දත්ත ලෙස යොදා ගැනීම
- දත්ත හා තොරතුරු තමාට මෙන් ම ජන සමාජයේ යහපැවැත්මට හේතු වේ

උදාහරණ:- - කාලගුණ තොරතුරු, ප්‍රවෘත්ති, සමාජ ආර්ථික තොරතුරු
වැදගත් ආයතනවල දුරකථන අංක (රාජ්‍ය තොරතුරු සේවය)
- දත්ත හා තොරතුරු විචාරශීලි ව භාවිත කිරීමේ වැදගත්කම

උදාහරණ:- - ජීවිත අවස්ථාවන්හි අවශ්‍යතා හා වුවමනා සපයා ගැනීමට හැකි වීම
- නිවැරදි තොරතුරු සන්නිවේදනය කර ගැනීම

- විවිධ සංසිද්ධිවලට සාර්ථක ව මුහුණ දීමට හැකි වීම
- ජීවිත අභියෝග හා අවස්ථා හමුවේ නිර්මාණශීලී චින්තනයෙන් යුතු ව කටයුතු කළ හැකි වීම

**ගුණාත්මක යෙදවුම්**

පුවත්පත් උද්ධෘත, ශීර්ෂ පාඨ, සිද්ධි අධ්‍යයන පිටපත්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

දත්ත හා තොරතුරු ලැබෙන මූලාශ්‍රය හා දත්ත හා තොරතුරු එදිනෙදා ජීවිතයට වැදගත් වන ආකාරය පිළිබඳ ව සිද්ධි අධ්‍යයනය ඇසුරින් ශිෂ්‍යශිෂ්‍යාවන් ට ප්‍රතිචාර දැක්වීමට අවස්ථාව ලබා දී ඇගයීම හා තක්සේරුකරණය ව සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

7.2.3. ජන සමාජයේ සාමාජිකයෙකු වශයෙන් නීතිමය රාමුව තුළ අයිතිවාසිකම් භුක්ති විඳීමට හුරු වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාවඃ 04 යි.**

**ඉගෙනුම් පල**

- අයිතිවාසිකම් නිර්වචනය කරයි.
- තමන්ට හිමි අයිතිවාසිකම් ලැයිස්තුගත කරයි.
- අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් වගුගත කරයි.
- නීතිමය රාමුවක් තුළ අයිතිවාසිකම් භුක්ති විඳීමේ වැදගත්කම පිළිගනිමින් අදහස් දක්වයි.
- ජන සමාජයේ යහපත් පුරවැසියකු වශයෙන් ජීවත් වීම සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංග ලැයිස්තුගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- අයිතිවාසිකම් හැඳින්වීම
- තමන්ට හිමි අයිතිවාසිකම්

  උදාහරණඃ- - ජීවත් වීමේ අයිතිය
  - අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය
  - කැමති ආගමක් ඇදහීමට ඇති අයිතිය
  - අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිය
  - ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය ආදි
- අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම්

  උදාහරණඃ- - අයිතිවාසිකම - අධ්‍යාපනය ලැබීම
  - යුතුකම - හොඳින් ඉගෙනීම

- නීතිමය රාමුවක් තුළ අයිතිවාසිකම් භුක්ති විඳීමේ වැදගත්කම
  - සෑම පුද්ගලයෙකුගේ ම පෞද්ගලික අයිතිය හා නිදහස ආරක්ෂා වීම
  - ශිෂ්ට සම්පන්න සමාජයක් බිහි වීම
  - ජනතා අවශ්‍යතා ඉටු වීම
  - සමාජය තුළ යහපත් අන්තර්පුද්ගල සම්බන්ධතා වර්ධනය වීම
  - යහපත් ජීවන ක්‍රමයක් ගොඩනගා ගත හැකි වීම

- ජන සමාජයේ යහපත් පුරවැසියෙකු වශයෙන් ජීවත් වීම සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංග
  - අන්‍යයන්ට ආදරය, දයාව, කරුණාව දැක්වීම
  - ප්‍රිය වචන භාවිතය, සුහදශීලිබව, චාම් දිවි පැවැත්ම
  - අන්මත ඉවසීම, පරාර්ථකාමීබව, අවංකබව
  - සහයෝගයෙන් කටයුතු කිරීම

- අයිතිවාසිකම් භුක්ති විඳිමින් ඒ හා බැඳුණු යුතුකම් ඉටු කිරීම
- සදාචාරාත්මක දිවි පෙවෙතක් ගත කිරීම
- නිතී ගරුක වීම

**ගුණාත්මක යෙදවුම්**

අයිතිවාසිකම් භුක්ති විඳින අවස්ථා දැක්වෙන චිත්‍ර/පෝස්ටර්, යුතුකම් ඉටු කරන අවස්ථා දැක්වෙන චිත්‍ර/පෝස්ටර්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

අයිතිවාසිකම් භුක්ති විඳින අවස්ථාවක්, යුතුකම් ඉටු කරන අවස්ථා දැක්වෙන චිත්‍ර/පෝස්ටරයක් නිර්මාණය කිරීමට යොමුකර එය ඇගයීමට හා තක්සේරුකරණයට ලක් කරන්න. නැතිනම් පන්තියේ ශිෂ්‍යශිෂ්‍යාවන් කණ්ඩායම් කිහිපයකට බෙදා අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කරන අවස්ථාවක් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීමට ඉඩ ලබා දී ඇගයීමට හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

7.2.4 රැකියා ස්ථානයේ වෘත්තිකයන්ගේ අයිතිවාසිකම් සුරකින නීති පිළිබඳ ගවේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව:** 04 යි.

**ඉගෙනුම් පල**

- වෘත්තිකයන් ආරක්ෂා කිරීම සඳහා සමාජයේ කාර්යභාරය පැහැදිලි කරයි.
- සමාජය තරුණයන් හා වයෝවෘද්ධයන් ආරක්ෂා කරන ආකාරය විස්තර කරයි.
- අන්‍ය සමාජ තුළ විවිධ නීති හැදෑරීම හා ළමයින් සහ වැඩිහිටියන්ට එහි ඇති බලපෑම පිළිබඳ දැනුම්වත් වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- වෘත්තිකයන්ගේ අයිතිවාසිකම් සුරකින නීති
  - රජයේ හෝ පෞද්ගලික අංශයේ සේවයේ නියුතු වෘත්තිකයන්ගේ අයිතිවාසිකම් සුරැකීම සඳහා ක්‍රියාත්මකවන නීති
  - වෘත්තීය අයිතිවාසිකම් සුරැකින නීතිවල අවශ්‍යතාව
  - නීති නිසි පරිදි ක්‍රියාත්මක නොවීමෙන් ඇති විය හැකි අයහපත් ප්‍රතිඵල හා අවාසි
- රැකියා ස්ථානයේ දී ළමා ශ්‍රමය සුරාකෑම වැළැක්වීම
  - වැඩෙහි යෙදවිය හැකි අවම වයස නියම කිරීම
  - අධ්‍යාපනය ලැබිය යුතු අනිවාර්ය වයස් සීමාව තුළ රැකියාවන්හි යෙදීමේ හේතු හා ඒවායේ බලපෑම්
  - ළමයින් (වයස 18 සම්පූර්ණ නොකළ අය) සේවයේ යෙදවීමෙන් ආරක්ෂාකර ගැනීම සඳහා සමාජයක ට ඇති වගකීම්
- විශ්‍රාම ගැන්වීමේ වයස
  - සේවා ස්ථානයෙන් විශ්‍රාම ගැන්වීම සඳහා පූර්ව සූදානම
  - විශ්‍රාමික කාලය ඵලදායි ව ගත කිරීමේ වැදගත්කම
- ඉටු කරන ලද කාර්යයට මූල්‍යමය ප්‍රතිලාභ ලැබීමට ඇති නීතිමය අයිතිය
  - වැටුප් සහ අතිකාල ලබා ගැනීම
  - හෘද සාක්ෂියට එකඟ ව සේවයේ යෙදවීම හා ලබන වැටුපට සරිලන සේවයක් ඉටු කිරීම
- සමාජය ළමයින්, තරුණයින්, හා වයෝවෘද්ධ අය ආරක්ෂා කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග
  - සේවා ආයතන හා සුබසාධක සේවා, වෘත්තීය සමිති
- අන්‍ය සමාජවල පවතින විවිධ නීති හා ළමයින් හා වැඩිහිටියන් ආරක්ෂා කිරීමට එමගින් කරන බලපෑම

**ගුණාත්මක යෙදවුම්**

වෘත්තීය අයිතිවාසිකම් සුරැකීම සඳහා විවිධ නීති ඇතුළත් විස්තර පත්‍රිකා, ළමා අයිතිවාසිකම් සම්මුතිය, මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ළමා කාලය තුළ (වයස අවුරුදු 18 ට සම්පූර්ණ  කිරීමට පෙර) හොඳින් අධ්‍යාපනය ලැබීමේ ඇති වැදගත්කම, අනාගත රැකියා ඉලක්ක පිළිබඳ ව අවධානය යොමු කිරීමත් අනාගත අභිවෘද්ධියට හේතු වන අයුරු විස්තර කෙරෙන පොත් පිංචක් සකස් කිරීමට ශිෂ්‍යශිෂ්‍යායවන් යොමුකර (කණ්ඩායම් ක්‍රියාකාරකමක්) නිර්ණායක මුලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

7.2.5 ජන සමාජයේ සාමාජිකයෙකු වශයෙන් මුහුණපාන අභියෝග හමුවේ නිර්මාණශීලී ව කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව:** 04 යි.

**ඉගෙනුම් පල**

- ජන සමාජයේ සාමාජිකයෙකු වශයෙන් මුහුණපාන අභියෝග හඳුනා ගෙන නම් කරයි.
- අභියෝග සාර්ථක ව ජය ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග විස්තර කරයි.
- අභියෝගවලට සාර්ථක ව මුහුණ දීමේ අවශ්‍යතාව පුද්ගල සංවර්ධනයට හේතු වන බව පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- ජන සමාජයේ සාමාජිකයෙකු වශයෙන් මුහුණපාන අභියෝග
  - විවේකය අඩු වීම
  - තරගකාරිත්වය
  - මාධ්‍ය මගින් එල්ල වන අනිසි බලපෑම්
  - විලාසිතා වැඩි වීම
  - සාරධර්ම පිරිහීම
  - දුම්වැටි, මත් ද්‍රව්‍ය මගින් එල්ල වන බලපෑම්

- අභියෝග සාර්ථක ව ජය ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

  උදාහරණ :-
  - නිර්මාණශීලී චින්තනයෙන් යුතු ව කටයුතු කිරීම
  - සරල ගති පැවතුම්, චාම් බවින් යුක්ත ව කටයුතු කිරීම
  - අප සතු දැනුම මෙන් ම බාහිර සාධක ද උපයෝගි කරගෙන නිවැරදි තීරණ ගැනීම
  - දැරිය හැකි ජීවන රටාවක් ගොඩනගා ගැනීමට යොමු වීම
  - නිවැරදි ජීවන අරමුණු ගොඩනගා ගෙන ඒවා ජය ගැනීම සඳහා සැලසුම් සහගත ව කටයුතු කිරීම
  - සමාජයේ පවත්නා හිතකර බලවේග ජීවිතයට ළඟාකර ගැනීම

**ගුණාත්මක යෙදවුම්**

- සමාජයේ දක්නට ලැබෙන විවිධ අභියෝග ඇතුළත් අවස්ථා දැක්වෙන සිද්ධි අධ්‍යයන පුවත්පත් වාර්තා, ප්‍රවෘත්ති, අභියෝග ජයගත් පුද්ගලයන්ගේ චරිතාපදාන
- නිර්මාණශීලී චින්තනයෙන් යුක්ත ව කටයුතු කළ අවස්ථා දැක්වෙන කතන්දර, ප්‍රවෘත්ති, වාර්තා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

අභියෝගවලට මුහුණ දීමේ දී අනුගමනය කරනු ලබන නිර්මාණශීලී ක්‍රියාමාර්ග දැක්වෙන භූමිකා රංගන කණ්ඩායම් ක්‍රියාකාරකම් ඇසුරින් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී සුදුසු නිර්ණායක ඔස්සේ ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

7.2.6 ජන සමාජයේ යහපත උදෙසා තම යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව**: 03 යි.

**ඉගෙනුම් පල**

- යුතුකම් හා වගකීම් යන්න අර්ථ දක්වයි.
- සමාජ යහපත සඳහා පුරවැසියකුගෙන් ඉටු විය යුතු යුතුකම් නම් කරයි.
- නීතිමය යුතුකම් හා සදාචාරාත්මක යුතුකම් වෙන්කර දක්වයි.
- වගකීම් ලැයිස්තුගත කරයි.
- යුතුකම් ඉටු කිරීම සමාජ යහපතට හේතු වන ආකාරය විස්තර කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- යුතුකම් හා වගකීම් හැඳින්වීම
  - පොදු සමාජ පැවැත්ම සඳහා පුරවැසියන් විසින් තම තමන්ට පැවරෙන කාර්යයන් ඉටු කිරීමට ඇති බැඳීම යුතුකම් වේ.
- සමාජ යහපත සඳහා පුරවැසියකුගෙන් ඉටු විය යුතු යුතුකම් නීතිමය හා සදාචාරාත්මක ලෙස වර්ග කළ හැකි ය.

- නීතිමය යුතුකම්
  - රජයට අවනත වීම
  - රාජ්‍ය නීති පිළිපැදීම
  - බදු ගෙවීම
  - රාජකාරිය නිසි ලෙස ඉටු කිරීම
  - නීතිය හා සාමය පවත්වා ගෙන යාමට සහාය දැක්වීම
- සදාචාරාත්මක යුතුකම්
  - දෙමාපියන්ට සැලකීම, වැඩිහිටියන්ට ගරු කිරීම
  - ආචාරශීලී වීම
  - සම්ප්‍රදායන් රැකීම
  - අන්‍ය ආගම්වලට හා ජාතීන්ට ගරු කිරීම
  - ජාතික සංකේතවලට හා ජාතික වීරවරයන්ට ගරු කිරීම

- **වගකීම්**

  යුතුකම් ඉටු කිරීමට ඇති බැඳීම වගකීම ලෙස හැඳින්විය හැකි ය
  - පොදු දේපළ ආරක්ෂා කිරීම
  - නීතිරීතිවලට ගරු කිරීම
  - යහපාලනයට ගරු කිරීම

- යුතුකම් හා වගකීම් අන්‍යෝන්‍ය වශයෙන් එකට බැඳී පැවතීම
- යුතුකම් හා වගකීම් ඉටුකිරීම සමාජ යහපතට හේතු වන ආකාරය
    - තමන්ගේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වීම
    - තෘප්තිමත් හා ගෞරවාන්විත ජන සමාජයක් බිහි වීම
    - යහපත් ජීවන ක්‍රමයක් ගොඩනගාගත හැකි වීම
    - යහපත් අන්තර්ජාතික සම්බන්ධතා පවත්වාගෙන යා හැකි වීම

**ගුණාත්මක යෙදවුම්**

නීතිමය යුතුකම් හා සදාචාරාත්මක යුතුකම් ඉටු කිරීම පිළිබඳ ව පළ වී ඇති පුවත්පත් වාර්තා, ඡායාරූප, සිද්ධි අධ්‍යයන, සාමය උදෙසා අයිතීන් සුරකිමු පොත.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

යුතුකම් හා වගකීම් ඉටු කිරීම පිළිබඳ සමාජ වගකීම් ශිෂ්‍යශිෂ්‍යාවන් සමඟ සාකච්ඡා කර ඔවුන් දක්වන ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින් නිර්ණායක මුලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

## නිදර්ශක ක්‍රියාකාරකම

| | | |
|---|---|---|
| **නිපුණතාව** | - | ජන සමාජයේ යහපත් සමාජිකයෙකු වශයෙන් තම අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කිරීමට පෙලඹෙයි. |
| **නිපුණතා මට්ටම** | - | ජන සමාජයේ යහපත උදෙසා තම යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටු කරයි. |
| **ඉගෙනුම් පල** | - | • සමාජ යහපත සඳහා පුරවැසියකුගෙන් ඉටු විය යුතු යුතුකම් නම් කරයි.<br>• යුතුකම් ඉටු කිරීම සමාජ යහපතට හේතු වන ආකාරය විස්තර කරයි. |
| **ක්‍රියාකාරකම** | - | " යුතුකම් ඉටු කරමු " |
| **කාලයඃ** | - | මිනිත්තු 40 යි. |
| **ගුණාත්මක යෙදවුම්** | - | බ්‍රිස්ල් බෝඩ්, ෆෙල්ට් පෑන්, ඇමුණුම 01 හි දැක්වෙන කාර්ය පත්‍රිකා |

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර I**

- ළමයෙක් වැඩිහිටියෙකුට උදව් කරන අවස්ථාවක් දැක්වෙන ඡායාරූපයක් පන්තියට ඉදිරිපත් කර වැඩිහිටියන් වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම පිළිබඳ ශිෂ්‍යශිෂ්‍යාවන් සමඟ සාකච්ඡා කරන්න.

**පියවර II**

- පන්තියේ ශිෂ්‍යශිෂ්‍යාවන් සුදුසු පරිදි කණ්ඩායම් 4කට වෙන් කරන්න
- ඇමුණුම් 01හි සඳහන් කාර්ය පත්‍රිකාව බැගින් එක් එක් කණ්ඩායමට බෙදා දෙන්න.
- කණ්ඩායම් වැඩ නිම කිරීම සඳහා එක් එක් කණ්ඩායම වෙත ගොස් අවශ්‍ය මඟ පෙන්වීම හා සහාය ලබා දෙන්න.

**පියවර III**

- කණ්ඩායම් වාර්තා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායම ඉදිරිපත් කරන තොරතුරු ඇසුරින් ඉගෙනුම් පල සාධනය වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

පහත දැක්වෙන නිර්ණායක පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක**

- තමාගෙන් ඉටු විය යුතු යුතුකම් හඳුනා ගෙන ඒවා පැහැදිලි කරයි.
- යුතුකම් ඉටු කිරීම සමාජයේ යහපැවැත්මට හේතු වන අයුරු විස්තර කරයි.
- කණ්ඩායම සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.
- ගුරු උපදෙස් පිළිපදියි.
- කණ්ඩායම් වාර්තා නිර්මාණශීලී ලෙස පන්තියට ඉදිරිපත් කරයි.

ඇමුණුම 01

**කාර්ය පත්‍රිකා අංක 01**

පාසල වෙනුවෙන් ඔබෙන් ඉටු විය යුතු යුතුකම් කණ්ඩායම සමග සාකච්ඡා කර ලයිස්තු ගත කරන්න. ඔබ වෙත සපයා ඇති බ්‍රිස්ල් බෝඩ්වල ඒවා සටහන් කර නිර්මාණශීලී ව පන්තියට ඉදිරිපත් කරන්න.

**කාර්ය පත්‍රිකා අංක 02**

තම ආගමික මධ්‍යස්ථානය හා පූජ්‍ය/පූජක පක්ෂය වෙනුවෙන් ඔබෙන් ඉටු විය යුතු යුතුකම් කණ්ඩායම් සමග සාකච්ඡා කර ලැයිස්තු ගත කරන්න. ඔබ වෙත සපයා ඇති බ්‍රිස්ල් බෝඩ් ප්‍රයෝජනයට ගෙන නිරිමාණශීලී ව එම තොරතුරු පන්තියට ඉදරිපත් කරන්න.

**කාර්ය පත්‍රිකා අංක 03**

ඔබ අයත් පවුල වෙනුවෙන් ඔබෙන් ඉටු විය යුතු යුතුකම් කණ්ඩායම් සමග සාකච්ඡා කර ලයිස්තු ගත කරන්න. ඔබ වෙත සපයා ඇති බ්‍රිස්ල් බෝඩ් ප්‍රයෝජනයට ගෙන නිර්මාණශීලී ව සකස් කර එම තොරතුරු පන්තියට ඉදිරිපත් කරන්න.

**කාර්ය පත්‍රිකා අංක 04**

සමාජයේ වැඩිහිටියන් (ජ්‍යෙෂ්ඨ පුරවැසියන්) වෙනුවෙන් ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් කණ්ඩායම සමග සාකච්ඡා කර ලයිස්තු ගත කරන්න. ඔබ වෙත සපයා ඇති බ්‍රිස්ල් බෝඩ් ප්‍රයෝජනයට ගෙන නිර්මාණශීලී ව සකස් කර එම තොරතුරු පන්තියට ඉදිරිපත් කරන්න.

## 7.3 අපේ සංස්කෘතිය

ශ්‍රී ලංකාව බහුසංස්කෘතික ජන සමාජයකින් සමන්විත වූවකි. සිංහල, ද්‍රවිඩ, මුස්ලිම්, බර්ගර්, මැලේ හා වෙනත් ජනවර්ගවලින් ද බෞද්ධ, හින්දු, ඉස්ලාම්, කතෝලික, ආදි ආගම් අදහන පිරිස් ද අප රටේ ජීවත් වෙති. විවිධ ජනවර්ගවලට අයත් විවිධ ආගම් අදහන මෙම පිරිස් එකිනෙකට වෙනස් සංස්කෘතිකාංගවලට උරුමකම් කියති. එම සංස්කෘතික බහුවිධතාව ඈත අතීතයේ සිට ම ශ්‍රී ලාංකික සමාජය පෝෂණය කිරීමට දායක වී ඇත.

ජාතික ආර්ථිකයට, ජාතික දේශපාලනයට මෙන් ම රාජ්‍ය පරිපාලනයට ද සියලු ජන වර්ග එක සේ දායක වන බැවින් සංස්කෘතික බහුවිධතාව අගය කළ යුතු වන්නේ ය. මෙම තත්ත්වය යටතේ තමන් කැමති ආගමක් ඇදහීමට, භාෂාවක් කතා කිරීමට, විශ්වාසයක් දැරීමට, හුදකලාව හෝ අන් අය සමඟ සංස්කෘතිය භුක්ති විඳීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ද ඉඩ ප්‍රස්තා සලසා ඇත.

අපේ සංස්කෘතිය නැමැති මෙම ඒකකය ඉගෙනීමේ ප්‍රධාන අරමුණ වන්නේ තම සංස්කෘතිය අගය කරමින් අන්‍ය සංස්කෘතීන්ට ද ගෞරව කිරීම සහ යහපත් ආකල්ප වර්ධනය කර ගැනීමට අවශ්‍ය පසුබිම සැකසීම යි. එමගින් සංස්කෘතික විවිධත්වය අගයමින් එක්සත් ව ජීවත් විය හැකි දරු පරපුරක් සමාජයට දායාද කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව**

- බහුසංස්කෘතික සමාජයක් තුළ සාමකාමී ව යහපත් පුරවැසියකු ලෙස ජීවත්වෙයි.

**නිපුණතා මට්ටම**

7.3.1 සෑම සංස්කෘතියක ම දක්නට ලැබෙන පොදු හා විශේෂ ලක්ෂණ විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව:** 04 යි.

**ඉගෙනුම් පල**


- සංස්කෘතිය යන්න නිර්වචනය කරයි.
- සංස්කෘතික අංග නම් කරයි
- සෑම සංස්කෘතියක ම දක්නට ලැබෙන පොදු ලක්ෂණ පැහැදිලි කරයි.
- එක් එක් සංස්කෘතියට අනන්‍ය වූ විශේෂ ලක්ෂණ විස්තර කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)


- සංස්කෘතිය නිර්වචනය කිරීම
- සංස්කෘතික අංග
  - භාෂාව හා සාහිත්‍යය
  - ඇඳුම් පැළඳුම්
  - ආහාරපාන
  - නීතිය
  - කලා ශිල්ප
  - අධ්‍යාපනය
  - සිරිත්විරිත්
  - ගුණධර්ම
  - විශ්වාස හා ඇදහිලි


සෑම සංස්කෘතියක ම දක්නට ලැබෙන පොදු ලක්ෂණ





එක් එක් සංස්කෘතියට අනන්‍ය වූ විශේෂ ලක්ෂණ

- සංස්කෘතික විවිධත්වයට හේතු




ආගම් අනුව විවිධත්වය
බෞද්ධ
හින්දු
ඉස්ලාම්
ක්‍රිස්තියානි/කතෝලික


ජීවනෝපාය අනුව විවිධත්වය
ගොවිතැන්
ධීවර
රාජ්‍ය සේවය
ව්‍යාපාර
වතුවගාව
හස්ත කර්මාන්තය
ස්වයං රැකියා

- සංස්කෘතික වෙනස්කම් දක්නට ලැබෙන වෙනත් අංශ
    - භාෂාව හා සාහිත්‍යය
    - කලාව
    - ආහාරපාන
    - ඇඳුම්පැළඳුම්
    - සිරිත්විරිත්

- විවිධ ආගම් හා ජනවර්ගවලට ආවේණික උත්සව

| | | |
|---|---|---|
| උදාහරණ:- | බෞද්ධ | - වෙසක් උත්සවය |
| | හින්දු | - තෛපොංගල් |
| | ඉස්ලාම් | - හජ්ජි උත්සවය |
| | ක්‍රිස්තියානි/කතෝලික | - නත්තල් උත්සවය |

- විවිධ සංස්කෘතික ලක්ෂණ හඳුනා ගත හැකි වෙනත් අවස්ථා

උදාහරණ:- විවාහ මංගල්‍ය අවස්ථා, අවමංගල්‍ය අවස්ථා

**ගුණාත්මක යෙදවුම්**

සංස්කෘතිය පිළිබඳ ඉදිරිපත් ව ඇති නිර්වචන, විවිධ සංස්කෘතික අංග දැක්වෙන පින්තූර, සෑම සංස්කෘතියකට ම පොදු ලක්ෂණ දැක්වෙන පින්තූර, එක් එක් සංස්කෘතියකට අනන්‍ය වූ ලක්ෂණ දැක්වෙන පින්තූර.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

විවිධ සංස්කෘතික ලක්ෂණ ඇතුළත් පින්තූර, රූප රාමු ආදිය එක්රැස් කර බිත්ති පුවත්පතක් වැනි නිර්මාණයක් සිදු කිරීමට ශිෂ්‍යශිෂ්‍යාවන් යොමු කරන්න. සුදුසු නිර්ණායක පදනම් කොට ගෙන ඒ සඳහා ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

7.3.2 තම සංස්කෘතික දායාද මෙන් ම අන්‍ය සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීමට දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව:** 04 යි.

**ඉගෙනුම් පල**

- තම සංස්කෘතික දායාද හඳුනා ගෙන නම් කරයි.
- තම සංස්කෘතික දායාද ආරක්ෂා කර ගත යුතු බව පැහැදිලි කරයි.
- අන්‍ය සංස්කෘතික දායාද හඳුනා ගෙන ඒවාට ගරු කිරීමේ වැදගත්කම පිළිගනිමින් අදහස් දක්වයි.
- සංස්කෘතික උරුම ආරක්ෂා කිරීමට නීතිමය හා සදාචාරාත්මක වශයෙන් බැඳී සිටීමේ වැදගත්කම විස්තර කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

• සංස්කෘතික දායාද හැඳින්වීම

සංස්කෘතිය විසින් පවරා දෙනු ලබන ගුණාංග

උදාහරණ:- කලා ශිල්ප

• ඒවා ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම

උදාහරණ:- - අතීත උරුමයන් පිළිබඳ අභිමානය වර්ධනය කර ගැනීමට හැකි වීම
- තම අනන්‍යතාව ආරක්ෂා කිරීම
- අන්‍ය සංස්කෘතින්ට ගරු කිරීමට හුරු පුරුදු වීම

• තම සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීම සඳහා ගතහැකි ක්‍රියා මාර්ග

උදාහරණ:- - සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීමේ වටිනාකම පිළිබඳ අන් අය දැනුවත් කිරීම
- සංස්කෘතික දායාදවලට හානි කර ක්‍රියාකාරකම්වලින් වැළකීම
- සංස්කෘතික දායාද හානි වන අවස්ථා ඇතොත් ඒ පිළිබඳ අදාළ ආයතනයන්ට දැනුම් දීම

• අන්‍ය සංස්කෘතික දායාද
- වෙනත් සංස්කෘතිවලට අයත් සංස්කෘතික දායාද හඳුනා ගැනීම

• ඒවාට ගරු කිරීමේ වැදගත්කම
- විවිධ සංස්කෘතික කණ්ඩායම් අතර සහයෝගය ගොඩනැගීම
- එම සංස්කෘතික දායාද පිළිබඳ දැනුම්වත් වීම හා ඒවාට ගරු කිරීමට හුරු පුරුදු වීම

• සංස්කෘතික දායාද රැක ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ග
- සංස්කෘතික උරුම, ආරක්ෂා කිරීම සඳහා නීතිමය වශයෙන් ඇති බැඳීම
- සංස්කෘතික උරුම ආරක්ෂා කිරීම සඳහා සදාචාරාත්මක වශයෙන් බැඳීම

• සංස්කෘතිය පවරා දීම
- පවුල

උදාහරණ :- සිරිත්විරිත්, ආචාර ධර්ම
- අධ්‍යාපන ආයතන, උදාහරණ :- නියමිත වේලාවට පැමිණීම හා පිටවීම
- ආගමික ආයතන, උදාහරණ :- කළ යුතු දේ නොකළ යුතු දේ පෙන්වා දීම

• සංස්කෘතිය ආරක්ෂා කිරීමේ වැදගත්කම

උදාහරණ:- ජාතික අනන්‍යතාව ආරක්ෂා වීම / ජාතික සමගිය ගොඩ නැගීම/ජාතික අභිමානය වර්ධනය වීම

**ගුණාත්මක යෙදවුම්**

විවිධ සංස්කෘතීන්වලට අයත් සංස්කෘතික උරුම දැක්වෙන පින්තූර ආදිය සපයා ගන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

තම සංස්කෘතික දායාද මෙන් ම අන්‍ය සංස්කෘතික දායාද ඇතුළත් පින්තූර, චිත්‍ර විස්තර ආදිය රැස්කර පොත් පිංචක් සකස් කිරීමට ශිෂ්‍යශිෂ්‍යාවන් යොමු කර අවසන් නිමැවුම නිර්ණායක පදනම් කර ගනිමින් ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

7.3.3 ජාතික අනන්‍යතාව පිළිබිඹු කෙරෙන සංකේත නිවැරදි ව භාවිත කරමින් ඒවාට ගරු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 04 යි.

**ඉගෙනුම් පල**

- ජාතික අනන්‍යතාව පිළිබිඹු කෙරෙන සංකේත නම් කරයි
- ජාතික අනන්‍යතාව පිළිබිඹු කෙරෙන සංකේතවල වැදගත්කම පැහැදිලි කරයි.
- ජාතික අනන්‍යතාව පිළිබිඹු කෙරෙන සංකේත නිවැරදි ව භාවිත කිරීම පිළිබඳ ව සාකච්ඡා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- ජාතික අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත
    - ජාතික කොඩිය
    - ජාතික ගීය
    - රාජ්‍ය ලාංඡනය
    - ජාතික වෘක්ෂය
    - ජාතික පුෂ්පය
    - ජාතික පක්ෂියා
    - ජාතික ක්‍රීඩාව
- ජාතික කොඩිය
- ජාතික කොඩිය ඔසවන අවස්ථා

  උදාහරණ - නිදහස් උත්සවය, වෙනත් රාජ්‍ය උත්සව, පාසලක හෝ ආයතනයක වැදගත් උත්සවයක්
- ජාතික කොඩිය භාවිත කිරීමේ දී අනුගමනය කළ යුතු පිළිවෙත්

  උදාහරණ - ආගමික කොඩි සමග ඔසවා තබන විට සමාන උසකින් ඔසවා තැබීම

  - රාත්‍රි කාලයේ ඔසවා තබන්නේ නම් අලෝකය ලැබෙන්නට සැලැස් වීම
- ජාතික කොඩිය ඔසවන අවස්ථාවල දී අනුගමනය කළ යුතු පිළිවෙත්

  උදාහරණ - ජාතික කොඩිය එසවීම හා පහත් කිරීම, සෙමෙන් හා ගෞරවාන්විත ව සිදු කිරීම
- පෙරහැරවල ජාතික කොඩිය භාවිතය

  උදාහරණ - වෙනත් කොඩි පෙළක් සමඟ ගෙන යන්නේ නම් එම කොඩි පෙළේ මැදට ඉදිරියෙන් ගෙන යාම
- කථික වේදිකාවක් මත ඔසවා තැබීම

  උදාහරණ - කථිකයා සභාවට මුහුණ දුන් විට ඔහුගේ දකුණු පසින් තිබෙන පරිදි කොඩි ගස ඔසවා තැබීම

• අඩකුඹු කිරීම

උදාහරණඃ- රජය විසින් ප්‍රකාශයට පත් කරන ජාතික ශෝක දිනයක දී ජාතික කොඩිය අඩකුඹු කර තැබීම

(කොඩි ගසේ මුදුනේ සිට උසින් 1/3 ක උස ප්‍රමාණයක් පහත් කර අඩකුඹු කිරීම)

• ජාතික කොඩියේ ගෞරවයට හානියක් නොවන ලෙස කටයුතු කිරීමේ වැදගත්කම

• ජාතික කොඩිය රටක ජාතික සංකේතයක් ලෙස සැලකෙන බැවින් එහි ගෞරවයට හානි නොවන ලෙස කටයුතු කිරීම වැදගත් බව

ඒ සඳහා නුගමනය කළ යුතු ක්‍රියාමාර්ග වන්නේ

- අඳින ඇඳුමක් හෝ ඇතිරිල්ලක් ලෙස භාවිත නොකිරීම
- කිසියම් දෙයක් දැමීමට හෝ දමා තබා ගැනීමට භාවිත නොකිරීම
- වෙළෙඳ භාණ්ඩ ප්‍රචාරණය සඳහා යොදා නොගැනීම
- හානියට පත් වූ අවලක්ෂණ වූ දුර්වර්ණ වූ ජාතික කොඩියක් ප්‍රදර්ශනය නොකිරීම

• ජාතික ගීය

- රටක ජාතික අනන්‍යතාව පෙන්නුම් කරනු ලබන සංකේතය වේ
- ජාතික ගීය ගායනා කරන අවස්ථා

උදාහරණඃ- - ජාතික උත්සවවලට

- ජාතික ගීය සරල බසින් පැහැදිලි කිරීම
- ජාතික ගීය ගායනා කිරීමේ අනුගමනය කළ යුතු ඉරියව්

උදාහරණඃ- - සීරුවෙන් සිටීම
- ජාතික ගීය නිවැරදි ව ගායනා කිරීම
- නිවැරදි තනුවට අනුව ගායනා කිරීම

• රාජ්‍ය ලාංඡනය

- රාජ්‍යයේ සංකේතය රාජ්‍ය ලාංඡනය වේ

1972 ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් වීමෙන් පසු ව දැනට භාවිත කරන රාජ්‍ය ලාංඡනය හඳුන්වා දෙනු ලැබීය.

• ජාතික පුෂ්පය හා ජාතික වෘක්ෂය
• ජාතික ක්‍රීඩාව
• ජාතික පක්ෂියා

**ගුණාත්මක යෙදවුම්**

ජාතික කොඩිය, ජාතික ගීය මුද්‍රණය කරන ලද පත්‍රිකා, රාජ්‍ය ලාංඡනය, ජාතික වෘක්ෂය, ජාතික පුෂ්පය, ජාතික පක්ෂියා, ජාතික ක්‍රීඩාව දැක්වෙන ඡයාරූප යොදා ගන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

නිවැරදි ඉරියව් භාවිත කරමින් ජාතික කොඩිය එසවීම, ඊට ගෞරව දැක්වීම හා ජාතික ගීය ගායනා කිරීමට අවස්ථාව සලසා සුදුසු නිර්ණායක යොදා ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

7.3.4 ස්වකීය සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ජාතික සමගිය ගොඩනැගීමට ප්‍රමුඛතාව දී කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :-** 04 යි.

**ඉගෙනුම් පල**

- තම සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- තම සංස්කෘතික අනන්‍යතාව රැක ගනිමින් ජාතික සමගිය ගොඩනැගීමේ වැදගත්කම පිළිබඳ ව අදහස් දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- තම සංස්කෘතික අනන්‍යතාව හඳුනා ගැනීම
  - කිසියම් ජනවර්ගයකට, ආගමික කොටසකට, ජන සමූහයකට පාරම්පරික ව උරුම සංස්කෘතිකාංගවල එකතු ව තම සංස්කෘතික අනන්‍යතාව යි.
- තම සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගන්නා අතර ම අනෙක් සංස්කෘතීන්වල අනන්‍යතාවට හානියක් නොවන අයුරින් ක්‍රියා කිරීම
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම හා ඒවා සුරැකීමට දායකත්වය ලබා දීම
- තම සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම
  - සංස්කෘතික විවිධත්වය ආරක්ෂා වේ
  - අනාගතය සඳහා සංස්කෘතික දායාද ආරක්ෂා වේ
  - තම සංස්කෘතික පිළිබඳ අභිමානය වර්ධනය වේ
- තම සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ජාතික සමඟිය ගොඩනැගීම
  - තම සංස්කෘතීන්ට ගරු කරන අතර ම අන්‍ය සංස්කෘතිවලට ද ගරු කිරීම
  - අන්‍ය සංස්කෘතික දායාද මෙන් ම විශ්වාසවලට ගරු කිරීම

**ගුණාත්මක යෙදවුම්**

විවිධ සංස්කෘතික උත්සව දැක්වෙන වීඩියෝ පට, චිත්‍ර, පින්තූර සපයා ගන්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

තම සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගැනීම මෙන් ම ජාතික සමගිය ගොඩනැගීම පිළිබඳ ශිෂ්‍යශිෂ්‍යාවන්ගේ ආකල්ප සංවර්ධනය උදෙසා සුදුසු ඇගයීම් ක්‍රමවේදයක් (උදාහරණ - විවාදයක්, කථික තරගයක් වැනි) යොදා ගෙන සුදුසු නිර්ණායක භාවිත කරමින් තක්සේරුකරණය කරන්න.

**නිපුණතා මට්ටම**

7.3.5 යහපත් පුරවැසියෙකු සතු සාරධර්ම අගය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** :- 04 යි.

**ඉගෙනුම් පල**

- සාරධර්ම යන්න කෙටියෙන් විස්තර කරයි
- සමාජයේ යහපැවැත්ම සඳහා සාරධර්මවල අවශ්‍යතාව පැහැදිලි කරයි.
- පුද්ගල සංවර්ධනයට අදාළ සාරධර්ම ප්‍රගුණ කරගත යුතු බව පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

(පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- සාරධර්ම අර්ථ දැක්වීම
  - සාරධර්ම යනු පුද්ගලයා, සමාජය හා ජීවිතය සාරවත් කරන, පොහොසත් කරන හා අර්ථවත් කරන මානුෂික ගුණාංග වේ
  - ජීවිතය සාරවත් කිරීම සඳහා සාරධර්ම වැදගත් වේ
  - සත්‍යගරුක වීම, අවංක බව, කරුණාව, දයාව දැක්වීම, සාමය සහ සහයෝගයෙන් ක්‍රියා කිරීම සාරධර්ම වේ
- සමාජ යහපැවැත්ම සඳහා සාරධර්මවල අවශ්‍යතාව
  - සෑම පුද්ගලයෙකු විසින් ම සාරධර්ම පිළිපැදිය යුතු වීම
  - සාරධර්ම පිළිපැදීම තුළින් සමාජ යහපැවැත්ම ගොඩනැගීම
  - සමාජ යහපැවැත්ම උදෙසා සාරධර්ම අත්‍යවශ්‍ය වීම
- අප විසින් සුරැකිය යුතු හා ගරු කළ යුතු සාරධර්ම
  - එදිනෙදා ජීවිතය තුළ අප විසින් කටයුතු කිරීමේ දී සාරධර්ම ආරක්ෂා කිරීම හා ඒවා අනුගමනය කිරීම

උදාහරණ - නිවස, පාසල, සේවා ස්ථානය ... වැනි

- පුද්ගල සංවර්ධනය සඳහා සාරධර්ම චරිතායනය කර ගැනීම
  - පුද්ගලයාගේ සංවර්ධනය සඳහා සාරධර්ම අත්‍යවශ්‍ය වීම
  - එදිනෙදා කටයුතු කිරීමේ දී සාරධර්ම තම ජීවිතයට බද්ධ කර ගැනීම සඳහා යොමු වීම
  - පුද්ගල සාරධර්ම චරිතායනය කර ගැනීම තුළින් යහපත් සමාජයක් ගොඩ නැගීම

**ගුණාත්මක යෙදවුම්**

සිරිත් මල්දම, ලෝකෝපකාරය, සුභාෂිතය වැනි කෘති පරිශීලනය කිරීමට ශිෂ්‍යශිෂ්‍යාවන් යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

සාරධර්ම හා ඒවා ජීවිතයට බද්ධ කර ගැනීමේ වැදගත්කම පිළිබඳ ව බිත්ති පුවත්පතකට සුදුසු ලිපියක් සකස් කිරීමට සලස්වා නිර්ණායක මුලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

## නිදර්ශක ක්‍රියාකාරකම

**නිපුණතාව** - බහුසංස්කෘතික සමාජයක් තුළ සාමකාමී ව යහපත් පුරවැසියකු ලෙස ජීවත් වෙයි.

**නිපුණතා මට්ටම** - ස්වකීය සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ජාතික සමගිය ගොඩ නැගීමට ප්‍රමුඛතාව දී කටයුතු කරයි.

**ඉගෙනුම් පල** • තම සංස්කෘතික අනන්‍යතාව රැක ගනිමින් ජාතික සමගිය ගොඩනැගීමේ වැදගත්කම පිළිබඳව අදහස් දක්වයි.

**ක්‍රියාකාරකම** - " තම අනන්‍යතාව සුරකිමු - ජාතික සමගිය ගොඩනගමු "

**කාලයඃ** - මිනිත්තු 40 යි

**ගුණාත්මක යෙදවුම්** - ඩිමයි කොළ, ෆෙල්ට් පෑන්, මාකර් පෑන්, කතුරු, ගම් ඇමුණුම 01

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර I**
- පන්තියේ ශිෂ්‍යශිෂ්‍යාවන් සුදුසු පරිදි කණ්ඩායම් කිහිපයකට බෙදන්න
- ඇමුණුම 01 හි සඳහන් ශ්‍රී ලංකාවේ ජනවාර්ගික හා ආගමික සංයුතිය දැක්වෙන වගු සටහන ශිෂ්‍යශිෂ්‍යාවන් ට ලබා දෙන්න.

**පියවර II**
- එම වගු සටහන ඇසුරින් පහත සඳහන් කරුණු ඉස්මතු වන පරිදි ශිෂ්‍යශිෂ්‍යාවන් අතර සාකච්ඡාවක් මෙහෙය වන්න
- ජනවාර්ගික සංයුතියේ විශේෂතා
- එක ම ජන කණ්ඩායමට අයත් පුද්ගලයන් විවිධ ආගමික කණ්ඩායම්වලට අයත් වීම
- එක ම කණ්ඩායම්වලට අයත් පුද්ගලයන් විවිධ භාෂා කතා කිරීම
- වාර්ගික හා ආගමික කරුණු මුල් කරගෙන ජන සමාජය විභේදනය නොවීම
- එම සාකච්ඡා ඇසුරින් මත වූ කරුණු පාදක කර ගනිමින් කණ්ඩායම් ඉදිරිපත් කිරීම සිදු කිරීමට අවස්ථා ව ලබා දෙන්න

**පියවර III**
- ශිෂ්‍යශිෂ්‍යාවන් විසින් කණ්ඩායම් සාකච්ඡා ව ඇසුරින් ඉදිරිපත් කරන ලද කරුණු ද යොදා ගනිමින් ඉගෙනුම් පල සාධනය වන පරිදි කෙටි සමාලෝචනයක යෙදෙන්න

- එහි දී තම සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම මෙන් ම ජාතික සමඟිය ගොඩනැගීම කෙරෙහි පුරවැසියෙකුගේ දායකත්වය පිළිබඳ ශිෂ්‍යශිෂ්‍යාවන් ට හැඟීමක් ඇති වන පරිදි තමාගේ මතය ඉදිරිපත් කිරීමට වග බලා ගන්න
- කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා ශිෂ්‍යශිෂ්‍යාවන් නිරත වූ ආකාරය හා දැක්වූ දායකත්වය පිළිබඳ ව ද අවධානය යොමු කරමින් පහත සඳහන් නිර්ණායක උපයෝගි කර ගෙන තක්සේරුකරණය කරන්න.

**ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක**

- ශ්‍රී ලංකාවේ ජනවාර්ගික හා ආගමික සංයුතිය පිළිබඳ ව අදහස් ඉදිරිපත් කරයි.
- කාලය නිසි පරිදි කළමනාකරණය කර ගනියි.
- කණ්ඩායම් තුළ සාමුහික ව කටයුතු කරයි.
- නිවැරදි තොරතුරු හා අදහස් දැක්වීමට යොමු වෙයි.
- ගුරු උපදෙස් පිළිපදිමින් කටයුතු කරයි.

ඇමුණුම 01

ශ්‍රී ලංකාවේ ජනවාර්ගික හා ආගමික සංයුතිය

| **ජනවර්ගය** | **ප්‍රතිශතය** | **ආගමික සංයුතිය** | **ප්‍රතිශතය** |
|---|---|---|---|
| සිංහල | 74.8 | බෞද්ධ | 70.19 |
| ඉන්දියානු දෙමළ | 4.16 | හින්දු | 12.61 |
| ශ්‍රී ලංකා දෙමළ | 11.21 | ඉස්ලාම් | 9.71 |
| මුස්ලිම් | 9.23 | ක්‍රිස්තියානි | 7.45 |
| බර්ගර් | 0.18 | වෙනත් | 0.06 |
| වෙනත් | 0.14 | | |

මුලාශ්‍රය :- ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, ජන සංගණන වාර්තාව - 2012

**පිටකවර නිර්මාණය**

රවීන්ද්‍ර තේනුවර

කථිකාචාර්ය

සෞන්දර්ය දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය